Allianz

**අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් (Allianz Insurance Lanka Limited)**
සමාගම් අංක PB 5179
25 - 27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ, අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 2
දුරකථන අංක : 0112 303 300 වෙබ් අඩවිය : www.allianz.lk විද්‍යුත් ලිපිනය : info@ allianz.lk

# මෝටර් වාහන රක්ෂණ ඔප්පුව

ඔබගේ අලියාන්ස් මෝටර් වාහන රක්ෂණ ඔප්පුව , ඔබ විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ සහ ප්‍රකාශයේ පදනම මත ඔබ සහ අප අතර ඇති කර ගත් ගිවිසුමකි.

ඔබ විසින් රක්ෂණ වාරිකය ගෙවීමට යටත්ව, ඔබගේ රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන දිනයේ සහ වේලාවේ සිට ඔබගේ රක්ෂණ ඔප්පුව බලාත්මක වන අතර උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආවරණ කාල සීමාව තුළ දිගටම බලාත්මක වී ආවරණ කාල සීමාවේ අවසාන දිනයේ මධ්‍යම රාත්‍රියේදී එම රක්ෂණ ඔප්පුව අවසන් වේ. තවද නියම හා කොන්දේසිවලට යටත්ව සහ රක්ෂණ අලුත් කිරීමේ වාරික ගෙවීම මත අප ඔබ සමග එකඟ වූ තවදුරටත් වූ කාලසීමාවක් සඳහා එම රක්ෂණ ඔප්පුව දිගටම බලාත්මක වේ.

රක්ෂිත සීමාවන් , මුදල් ගෙවීමේ අවශ්‍යතා, නියම,කොන්දේසි සහ ව්‍යතිරේක ඔබේ රක්ෂණ ඔප්පුවේ අදාළ කොටස්වලට අදාළ විය යුතුය.

**රක්ෂණ ඔප්පුව , යෝජනා ආකෘති පත්‍රය, දැනට බල පවත්නා රක්ෂණ සහතිකය සහ උපලේඛනය එක කොන්ත්‍රාත්තුවක් ලෙස එකට කියවිය යුතුය.**

## ආවරණය

ඔබගේ උපලේඛනයේ සහ රක්ෂණ සහතිකයේ සඳහන් පරිදි ඔබගේ රක්ෂණ ඔප්පුවේ සඳහන් නියම, කොන්දේසි සහ ව්‍යතිරේකවලට යටත්ව-

**අ. සම්පූර්ණ රක්ෂණය-**

1. වන සහ 2 වන වගන්ති අදාළ වේ.
3 වන වගන්තිය අදාළ වනුයේ පෞද්ගලික කාර්වලට පමණි.

**ආ. 3 වන පාර්ශවයේ රක්ෂණය-**

2 වන වගන්තිය අදාල වේ.

## බැරකමේ සීමාවන්

රක්ෂණ ඔප්පුවේ හෝ උපලේඛනයේ අන්‍යාකාරයකට නිශ්චිතව දක්වා ඇත්නම් මිස, එක මාර්ග අනතුරක්/පාඩුවක් සම්බන්ධයෙන් වන අපගේ බැරකම පහත දැක්වෙන පරිදී සීමා කර ඇත.

| | පෞද්ගලික කාර් | ශ්‍රී ලංගම සමග සම්බන්ධීකරණය වී කුලියට ධාවනය වන බස් රථ | අනෙක් සියළු වාහන |
|---|---|---|---|
| 2-1(i) වගන්තිය යටතේ අපගේ බැරකම | සීමාවක් නැත | සීමාවක් නැත | සීමාවක් නැත |
| 2-1(ii) වගන්තිය යටතේ අපගේ බැරකම | රුපියල් මිලියන 10 | රුපියල් මිලියන 5 | රු.15,000,00 |

## 1 වන වගන්තිය:

**ඔබගේ වාහනය සඳහා ආවරණය.**

1. පහත දැක්වෙන සිද්ධීන් හේතුකොට ගෙන ඔබේ වාහනයට සහ එහි උපාංගවලට සහ අමතර කොටස්වලට සිදුවන පාඩු හෝ අලාභ සඳහා අප විසින් ආවරණය සපයනු ලැබේ. එම සිද්ධීන් මෙසේය :-

    i. වාහන එකිනෙක ගැටීම, පෙරළීම හෝ වෙනත් යම් අනතුරුදායක බාහිර ක්‍රියා፡

    ii. ගින්න, බාහිර පිපිරීම්, ඉබේ ගිනිගැනීම හෝ අකුණු ගැසීම፡

    iii. ද්වේශ සහගත ක්‍රියා፡

    iv. ගෙවල් බිඳීමේ සොරකම, ගෙවල් බිඳීම සහ සොරකම፡

    v. භූමිකම්පා, පස් කණ්ඩි කඩා වැටීම, නාය යාම , කඳු කඩා වැටීම, ගංවතුර, සුළි සුළඟ ,චණ්ඩ මාරුත , අධික සුළං, ප්‍රචණ්ඩ කුණාටු, නිවර්තන සුළං, හිම කැට කුණාට, අයිස්වලින් වැසීම, ටොනාඩෝ කුණාට, මුහුදු රැල්ල අධික වීම, සුනාමි, මුහුදු කම්පන සහ ගිනිකඳු පිපිරීම්፡

    vi. පාරෙන්, දුම්රියෙන්, දේශීය ජල තීරය හරහා, සෝපානයෙන් හෝ එලිවේටර් හරහා ප්‍රවාහනය කරමින් තිබියදී፡

2. කෙසේ වුවද පහත දැක්වෙන කරුණු සඳහා අප මුදල් නොගෙවනු ලැබේ.

    i. එම අවස්ථාවේදීම වාහනයටත් අලාභ හානි වන්නේ නම් මිස, ටයර් සහ ටියුබ්වලට සිදුවන අලාභ හානි එවැනි අවස්ථාවකදී අපගේ වගකීම ටයර්/ ටියුබ් වෙනුවට අලූත් ටයර්/ ටියුබ් ලබාදීමේ වියදම් 50%ක් නොඉක්මවිය යුතුය.

    ii. එම අවස්ථාවේදීම වාහනයටද අලාභ හානි සිදුවන්නේ නම් මිස, වාහනයේ ඇති එයාර් බෑග් සඳහා፡

    iii. පෞද්ගලික කාර් සම්බන්ධයෙන් හැර, සහ වාහනය එම අවස්ථාවේදී සොරකම් කරන්නේ නම් මිස, ගෙවල් කැඩීම සහ සොරකම මඟින් වාහනයේ උපාංගවලට, අමතර කොටස්වලට සහ වැදගත් කොටස්වලට සිදුවන පාඩුවක් හෝ අලාභයක්፡

    iv. වැඩිපුර බඩු පැටවීම මගින් හෝ දැඩි ප්‍රයත්නයක් දැරීම මගින, හෝ වාහනයේ පටවා ඇති භාණ්ඩවල ස්වභාවය අනුව සිදුවන පාඩුව සම්බන්ධයෙන, ක්ෂයවීම, කොටස් ගෙවීම, යාන්ත්‍රික හෝ විදුලි හෝ විද්‍යුත් පද්ධති බිඳ වැටීම සම්බන්ධයෙන් සක්‍රියවීම සම්බන්ධයෙන්፡

    v. පහත දැක්වෙන අවස්ථාවලදී ඔබගේ වාහනයට සිදුවන පාඩු හෝ අලාභ එනම්፡-

        (අ) ඔබේ සේවා නියුක්තයකු විසින් හෝ බලයලත් රියදුරා විසින් සොරකම් කිරීම නිසා හෝ මාරු කිරීම නිසා፡

        (ආ) නිෂ්පාදකයාගේ මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් ධාවනය කරනු ලබන විට፡

        (ඇ) වාහනය ඇදගෙන යාමේදී, ප්‍රවාහනය කිරීමේදීද බඩු පැටවීමේදී හෝ අලාභ සිදු වූ වාහනය පිළිබඳව ක්‍රියා කිරීමේදී ඔබේ හෝ ඔබගේ නියෝජිතයාගේ නොසැලකිල්ල නිසා පාඩුව වැඩි වූයේ නම්፡

        (ඈ) ද්‍රාවස්ථා විද්‍යාත්මක හිරවීම නිසා (hydrostatic lock), එන්ජින් ඔයිල් කාන්දුවීම නිසා, තෙල් උෂ්ණතාවය නිසා, කූලන්ට් ද්‍රාවණය කාන්දු වී තිබීම නිසා සිදු වන පාඩු හෝ අලාභ፡

3. බස්, මගීන් ප්‍රවාහන බස් සහ මෝටර් කෝච් වශයෙන් ලියාපදිංචි කර ඇති වාහනවල වින්ඩ්ස්ක්‍රීන්වලට , ජනෙල් වීදුරුවලට අලාභහානි සිදුවීමේදී අප විසින් ඒ සඳහා අලාභ වශයෙන් ඔබ රක්ෂණය කර ඇති මුදලින් 10% ක් හෝ අලාභය සිද්ධ වූ අවස්ථාවේදී වාහනයේ වෙළඳපල වටිනාකම සහ සංඛ්‍යා දෙකෙන් වඩා අඩු වටිනාකම ඔබට ගෙවනු ලැබේ.

4. අනතුරක් හේතු කොට ගෙන වාහනයක් ක්‍රියා විරහිත වුවහොත් , වාහනය ආරක්ෂා කිරීමේ සාධාරණ වියදමක් සහ අප අනුමත කල ළඟම සිටින අළුත්වැඩියා කරන ආයතනය වෙත වාහනය රැගෙනයාමේ වියදම හා වාහනය ඔබ වෙත ආපසු රැගෙන ඒමේ වියදම අප විසින් ඔබට ගෙවනු ලැබේ. කෙසේ වුවද එක් මාර්ග අනතුරක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් මෝටර් සයිකල් සඳහා රු.500/-ක් ද වෙනත් වාහන සඳහා රු.1,500/-ක් ද ගෙවනු ලැබේ.

5. අනතුර සිදුවන අවස්ථාවේදී ඔබගේ වාහනයට වෙනත් අලාභ හානිද සිදුවුවහොත් අනතුරින් ඔබගේ බැටරියට හෝ ඉන්වර්ටර් යන්ත්‍රයට සිදුවන පාඩුව සඳහා අප විසින් ඔබට මුදල් ගෙවනු ලැබේ.

බැටරිය හෝ ඉන්වර්ටර් යන්ත්‍රය සම්බන්ධයෙන් අපගේ වගකීම් වනුයේ ඔබ වාහනය රක්ෂණය කර ඇති මුදලින් 10%ක් හෝ අනතුර සිදු වන අවස්ථාවේදී ඔබේ වාහනයේ වෙළඳපොල වටිනාකමින් 10%ක් හෝ එවැනි බැටරියක හෝ ඉන්වර්ටර් යන්ත්‍රයක දැනට පවතින වෙළඳපොල වටිනාකම හෝ බැටරිය හෝ ඉන්වර්ටර් යන්ත්‍රය පැරණි තත්වයට පත්කිරීමට අළුත්වැඩියා කිරීමේ වියදම සහ සංඛයාවලින් වඩා අඩුම වටිනාකම වේ. (මෙය අදාළ වනුයේ හයිබ්‍රිඩ්/ඉලෙක්ට්‍රික් වාහන සඳහා පමණි)

6. ලංකා ගමනාගමන මණ්ඩලය සමග ඒකාබද්ධව මගී ප්‍රවාහන බස් රථ ආවරණය වන පරිදී මෙම රක්ෂණ ඔප්පුව ව්‍යාප්ත කර ඇති අවස්ථාවකදී:

i. 1 වන වගන්තිය යටතේ අදාළ වන වෙනත් අතිරික්තයන්ට අමතර ඔබගේ රක්ෂණ ඔප්පුව එක් එක් හිමිකම්පෑම මත රු.5,000/-ක අතිරික්තයකට යටත් වේ.

ii. ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ  රක්ෂණය කර ඇති වාහන වර්ගය පැදවීමට ඔබගේ එක් එක් රියදුරා යෝග්‍ය බවට ස්ථිර කරමින් ඔබගේ රියදුරන් සම්බන්ධයෙන් ලංකා ඔටෝ මොබයිල් සංගමය (AAC) විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකයක් ඔබ විසින් අපට ඉදිරිපත් කළයුතු අතර එම රියදුරන්ගේ රියදුරු පළපුරුද්ද අදාළ පංතිය සම්බන්ධයෙන් අවුරුදු තුනකට (3) වැඩි විය යුතුය.

iii. ඔබගේ රියදුරා වයස අවුරුදු 65 කට වඩා අඩු පුද්ගලයකු විය යුතු අතර ඔබගේ වාහනය වයස අවුරුදු 30 ට අඩු පුද්ගලයකු ධාවනය කරන්නේ නම් ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ වන වෙනත් අතිරික්තයන්ට අමතර යම් හිමිකම්පෑමක් රු.1,000/- ක අතිරික්තයකට යටත් වේ.

iv. ඔබගේ වාහනය පාවිච්චි කල වාහනයක් නම් (Second hand) හෝ නැවත අලුත්වැඩියා කල වාහනයක් නම්(Reconditioned) වාහනයේ යෝග්‍යතාව ස්ථිර කරන සහ මහා මාර්ගයේ ගමන් කිරීමට සුදුසු බව ස්ථිර කරන සහතිකයක් ඔබ විසින් වාහනයේ නිෂ්පාදකයාගෙන් හෝ වාහනයේ දේශීය නියෝජිතයාගෙන් හෝ ලංකා ඔටෝ මොබයිල් සංගමයෙන් ලබා ගත යුතුය.

7. ඔබගේ වාහනය කුලියට ධාවනය කිරීම ආවරණය වන පරිදී ඔබගේ රක්ෂණ ඔප්පුව ව්‍යාප්ත කර ඇත්නම්-

i. 1 ඔබගේ වාහනය ගාස්තුවක් හෝ මුදලක සඳහා මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීමට ඔබ විසින් හෝ ඔබගේ සේවකයකු විසින් හෝ ඔබගේ බලයලත් රදයැදුරා විසින් පැදවිය යුතුය.

ii. ඔබගේ වාහනය ඔබගේ භාරකාරිත්වය ,පාලනය සහ අධීක්ෂණය යටතේ පැවතිය යුතුය.

## 2 වන වගන්තිය:

## තුන්වන පාර්ශවයන්ට ඇති වගකීම්.

1. අපගේ වගකීමේ සීමාවන්ට යටත්ව පහත දැක්වෙන අවස්ථා සම්බන්ධයෙන් ඔබගේ වාහනය සම්බන්ධ වන අනතුරක ප්‍රතිපලයක් ලෙස පැන නගින ඔබගේ නෛතික වගකීම අප විසින් ආවරණය කරනු ලැබේ. එම අවස්ථා පහත දැක්වෙන පරිදී වේ:-

i. අනතුරින් යම් තැනැත්තකු මියයාම හෝ ඔහුට හෝ ඇයට ශාරීරික තුවාල සිදුවීම:

යම් දේපලකට සිදු වන අලාභයක්:

ii. අනතුර සිදුවන අවස්ථාවේදී ඔබගේ ගාස්තු අයකරන මගීන් රැගෙන යන වාහනයේ ගමන් කරන අතරතුර හෝ වාහනයට ඇතුළු වන විට හෝ පිට වන විට යම් මගියකුගේ මරණය සිදුවීම හෝ යම් මගියකුට ශාරීරික තුවාල සිදුවීම යන අවස්ථාවලදී එක් මගියකු සඳහා අපගේ උපරිම වගකීම රු.2,000/- කට සීමා වේ. වාහනය සඳහා අවසරදී ඇති උපරිම මගීන් සංඛ්‍යාවට වඩා වැඩි මගීන් ප්‍රමාණයක් රැගෙන ගියහොත්, අප විසින් ගෙවිය යුතු සම්පූර්ණ හිමිකම්පෑමට අදාළ මුදලින් අනුපාතික මුදලක් ඔබ විසින් අපට ගෙවනු ලැබිය යුතුය.

2. කෙසේ වුවද, පහත දැක්වෙන අවස්ථා අප විසින් ආවරණය කරනු නොලැබේ. එම අවස්ථා මෙසේය:-

i. ඔබගේ පවුලේ සාමාජිකයකුගේ මරණය සිදු වීම හෝ එවැනි සාමාජිකයකුට ශාරීරික තුවාල සිදුවීම හෝ ඔබ යටතේ සේවය කරන තැනැත්තකු එම සේවය අතරතුර හෝ එම සේවය නිසා ඔහුගේ / ඇයගේ මරණය සිදු වීම හෝ එවැනි අයකුට ශාරීරික තුවාල සිදු වීම:

ii. ඔබට අයත් හෝ ඔබ විසින් භාරයක් ලෙස දරා සිටින හෝ ඔබගේ භාරකාරිත්වය හෝ පාලනය යටතේ පවතින දේපලකට හෝ ඔබගේ නිවසේ සිටින අයකුගේ හෝ පවුලේ සාමාජිකයකුගේ දේපලකට හෝ ඔබ වෙනුවෙන් ක්‍රියා කරන හෝ ඔබ විසින් බලය පවරා ඇති තැනැත්තකුගේ දේපළට සිදු වන අලාභ හානි.

iii. ඔබගේ වාහනය දෙදරීම මගින් හෝ ඔබගේ වාහන්යේ බර අනූව හෝ ඔබගේ වාහනයේ රැගෙන යන භාණ්ඩවල බර අනූව යම් පාලමකට, වාහනවල බර කිරන යන්ත්‍රයකට,බෝක්කුවකට හෝ පාරකට යටින් ඇති දෙයකට සිදු වන අලාභයක:

iv. (පෞද්ගලික කාර් සහ මෝටර් සයිකල් හැර) ඔබේ වාහනයකට බඩු පැටවීම හෝ වාහනයෙන් බඩුබෑම සම්බන්ධයෙන් කරත්ත පාරක හෝ මහ පාරක සීමාවෙන් පිටත සිදු වන පුද්ගල මරණයක් හෝ පුද්ගලයකුට සිදු වන තුවාල වීම හෝ අලාභ වීම:

v. ඔබගේ වාහනයෙන් පිට වන ගිනි පුපුරු මගින් හෝ අළුවලින් දේපලකට සිදුවන අලාභ නැතහොත් ඔබගේ වාහනයේ බොයිලේරුව පිපිරීමෙන් සිදු වන අලාභ:

vi. ඔබගේ වාහනයේ කොටසක් වන යම් මෙවලමක් මගින් හෝ සවිකර ඇති උපකරණයක් මගින් යම් තැනැත්තකුගේ මරණය සිදු වීම, යම් තැනැත්තකුට තුවාල සිදු වීම හෝ අලාභ හානි සිදු වීම.

3. අපගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමට යටත්ව අප විසින් සියලූ පිරිවැය සහ වියදම් ගෙවනු ලැබේ.

4. ඔබගේ වාහනය බලයලත් තැනැත්තකු විසින් ධාවනය කර ඇත්නම්-

i. එම තැනැත්තාට වෙනත් රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය ලබා ගැනීමට හිමිකමක් නැත්නම් ඃ සහ

ii. එම තැනැත්තා ඔබේ රක්ෂණ ඔප්පුවේ සියලූ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇත්නම්,

අප විසින් එම තැනැත්තා ආවරණය කරනු ලැබේ.

5. යම් තැනැත්තකුගේ පෞද්ගලික නියෝජිතයා මෙම රක්ෂණ ඔප්පුවේ සියලූ නියම කොන්දේසි සහ ව්‍යතිරේක අනුගමනය කරන්නේ නම්, සපුරාලන්නේ නම් සහ අනුකූලව ක්‍රියාකරන්නේ නම් ඔහු මිය යන අවස්ථාවකදී මෙම රක්ෂණ ඔප්පුව යටතේ හිමිකම් ලැබීමට ඇති එම තැනැත්තා අප විසින් ආවරණය කරනු ලැබේ.

6. (අ) මෙම රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය ලැබී ඇති හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිපලය ඇති කරවන සිද්ධියක් වන ඔබගේ වාහනය හා සම්බන්ධ මරණයක් සම්බන්ධයෙන් පවත්වනු ලබන පරික්ෂණයකදී හෝ මරණ පරික්ෂණයකදී අප විසින් අපගේ අභිමතය පරිදී ඔබ නියෝජනය කරනු ලැබේ.

(ආ) මෙම රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය ලැබී ඇති හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලය ඇති කරවන සිද්ධියක් වන ඔබගේ වාහනය හා සම්බන්ධ මරණයක් සම්බන්ධයෙ පවත්වනු ලබන පරික්ෂණයකදී හෝ මරණ පරික්ෂණයකදී අප විසින් අපගේ අභිමතය පරිදී ඔබ නියෝජනය කරනු ලැබේ.

## 3 වන වගන්තිය:

## වෛද්‍ය වියදම් (පෞද්ගලික කාර් සඳහා පමණි)

ඔබගේ වාහනය හා සම්බන්ධ අනතුරකින් සිදුවන ශාරීරික තුවාල සඳහා  සාධාරණ වෛද්‍ය වියදම් ඔබේ මෝටර් රථයේ පඩි ගෙවන ඔබගේ රියදුරා හැර, ඔබට හෝ වාහනයේ ගමන් ගත් අයකුට අප විසින් සාධාරණ වෛද්‍ය වියදම් වශයෙන් එක් අනතුරක් සඳහා රු.1,500/- ක උපරිම සීමාවකට යටත්ව මුදල් ගෙවනු ලැබේ.

## 4 වන වගන්තිය:

## සාමාන්‍ය බැහැර කිරීම.

පහත දැක්වෙන අවස්ථාවලදී සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා අප විසින් මුදල් ගෙවනු නොලැබේ.

1. ශ්‍රී ලංකාවේ ගොඩබිම් සීමාවෙන් පිටතදී සිදු වූ පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා:

2. යම් ගිවිසුම්කාරී බැරකමකින් පැන නගින පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා:

3. i. දැනට බලපවත්නා මෝටර් රක්ෂණ සහතිකය මගින් අවසරදී නැති යම් කාර්යයක් සඳහා භාවිතා කරමින් සිටින විට සිදු වූ හෝ සිදු කිරීමට සලස්වන ලද යම් පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා:

   ii. දැනට බලපවත්නා මෝටර් රක්ෂණ සහතිකය මගින් අවසරදී නැති යම් තැනැත්තකු විසින් හෝ එම තැනැත්තාගේ පාලනය යටතේ මෝටර් රථය ධාවනය කරන අතර තුර සිදුවන හෝ සිදුවීමට සලස්වන ලද යම් පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා:

4. ආක්‍රමණය කිරීමකින් ,විදේශ සතුරන්ගේ ක්‍රියාවකින්, එදිරිවාදීකමකින්, හෝ යුද්ධය වැනි මෙහෙයුමකින්, සිවිල් යුද්ධයකින්, වැඩ වර්ජනයකින, කැරලි කෝලාහලවලින්, සිවිල් කෝලාහලවලින් ,හමුදාවේ කැරලි ගැසීම්වලින්, විප්ලවවලින්, යුක්ෂමය හෝ රාජ්‍ය බලය යෙදවීම මගින් හෝ මෙම ක්‍රියාදාමවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සිදුවීම්වලින් සෘජුවම හෝ අන්‍යාකාරයකට පැන නගින පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක් සඳහා:

5. හදිසි අනතුර හෝ පාඩුව සිදුවූ අවස්ථාවේදී යම ආකාරයකින් හෝ ක්‍රමයකින් යම් මත්පැන් වර්ගයක් හෝ මත්ද්‍රව්‍ය හෝ වෙනත් මත්වීමේ ද්‍රව්‍යක් පානයකරමින් පානයකිරීමෙන් පසුව ඔබ හෝ වෙනත් තැනැත්තකු ඔබේ වාහනය පදවාගෙන යන්නේ නම්:

6. (අ) යම් දිනයක් ස්වකීය ලිත් දිනය වශයෙන් හඳුනාගැනීමට අපොහොසත් වන යම් මයික්‍රෝචිප, ඇතුලත් කරන ලද චිප්, ඉන්ටිග්‍රේටඩ් පරිපථ හෝ සමාන උපකරණයක් ඇතුළත් විදුලිය අඩාල වීමෙන්, ක්‍රියාවිරහිතවීමෙන් හෝ අක්‍රියවීමෙන් සිදුවන පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක්:

   (ආ) යම් පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංග වැඩසටහනක්, ද්වේශ සහගත සංකේතයක, පරිගණක වයිරස් හෝ වෙනත් අයට හානි කිරීමට සවිකරන ලද ක්‍රියාවලියන් හෝ වෙනත් විද්‍යුත් පද්ධතියන් මගින් පැන නගින පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකමක්:

7. පහත දැක්වෙන සිදුවීම් මගින් සිදු වන පාඩු හෝ අලාභ හෝ බැරකම් සඳහා අප විසින් මුදල් ගෙවනු නොලැබේ.

   (අ) යම් න්‍යෂ්ටික ඉන්ධනවලින් හෝ යම් න්‍යෂ්ටික අපද්‍රව්‍යවලින් හෝ න්‍යෂ්ටික ඉන්ධන දහනයවීම මගින් ඇති වන අයනීකරණ විකිරණවලින් හෝ විකිරණ ක්‍රියාකාරීත්වය විෂවීම මගින් සිදුවන පාඩු හෝ අලාභ හෝ බැරකම් සඳහා:

   (ආ) යම් න්‍යෂ්ටික උපකරණ සවි කර ඇති ස්ථානයක්, න්‍යෂ්ටික ප්‍රතික්‍රියා යන්ත්‍රයක, වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ න්‍යෂ්ටික සංරචනයක හෝ විකිරණශීලී ද්‍රව්‍යක විකිරණශීලී, විෂසහිත ,පුපුරණ ගති ලක්ෂණවලින් හෝ වෙනත් අනතුරුදායක විෂ සහිත ගුණාංගවලින් සිදුවන පාඩුවක් හෝ අලාභයක් හෝ බැරකම සඳහා:

   (ඇ) පරමාණු හෝ න්‍යෂ්ටික විඛණ්ඩනය සහ / හෝ වියලනය මගින් ක්‍රියාත්මක වන යම් ආයුධයක් හෝ උපකරණයක් මගින් සිදුවන අපාඩුවක් හෝ අලාභ හෝ බැරකම්:

   (ඈ) යම් රසායනික, ජීව විද්‍යාත්මක, ජීව රසායනික හෝ විද්‍යුත් චුම්භක ආයුධයක් මගින් සිදුවන පාඩු හෝ අලාභ හෝ බැරකම්:

8. (අ) දුනු පිහියක් මගින් ඔබේ වාහනයට සිදු වන පාඩු හෝ අලාභ හෝ බැරකම්:

   (ආ) පොලිස් නිලධාරියකු විසින් ධාවනය කරනු ලබන විට/රඳවා තබා ගන්නා විට ඔබේ වාහනයට සිදුවන පාඩු හෝ අලාභ හෝ බැරකම්:

   (ඇ) කල්බදු සමාගමක්/මූල්‍ය සමාගමක් වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තන් විසින් ඔබේ වාහනය ඔවුන්ගේ භාරයට ගත් විට හෝ අත්පත් කරගත් විට සහ එකී වාහනය එම සමාගමේ භාරකාරීත්වය හෝ පාලනය යටතේ පවතින විට, සිදු වන පාඩු හෝ අලාභ හෝ බැරකම්:

   (ඈ) ඔබ හෝ ඔබ වෙනුවෙන් ක්‍රියාකරන යම් තැනැත්තකු විසින් විස්තර කර ඇති පරිදී වාහනයට සිදුවූ අනතුර හෝ අලාභ හෝ පාඩුවලට අනුකූල නොවන අනතුරකට හෝ පාඩුවලට හෝ අලාභයකට:

   (ඉ) ඔබ හෝ ඔබේ බලයලත් රියදුරා විසින් යම් වරදක් සිදුකිරීම සඳහා වාහනය භාවිතා කරන විට සිදුවන පාඩු හෝ අලාභ හෝ බැරකම්:

9. (අ) ඔබේ වාහනයට බඩු පටවන විට හෝ එම වාහනයෙන් බඩු බාන විට හෝ ව්‍යාපාර ක්ෂේත්‍රයට අදාළ මෙවලමක් ලෙස භාවිත කරන විට වාහනය පෙරළීමෙන් ඔබේ වාහනයට හෝ එහි අමතර උපාංග වලට සිදුවන පාඩුවක් හෝ අලාභයක් හෝ ඒ මත පැන නගින බැරකමක්:

   (ආ) රූස්වීම්වලට, පෙළපාලිවලට, තරගවලට ,පරික්ෂා කිරීම්වලට වේග තරගවලට හෝ වෙනත් අනතුරුදායක ක්‍රියා තරගවලට ඔබේ වාහනය සහභාගීවීමේ ප්‍රතිඵලයක් ලෙස ඔබේ වාහනයට හෝ එහි අමතර කොටස්වලට සිදුවන අලාභ හෝ පාඩු හෝ බැරකම්:

10. ශ්‍රී ලංකාව හැර , වෙනත් රටකදී ඔබේ වාහනයේ යම් දෝෂයක් පරික්ෂා කිරීමේදී හෝ වෙනත් රටකදී වාහනයට කරන ලද අළුත්වැඩියා කිරීමේදී දරන ලද වියදම්:

11. සම්බාධක වගන්තිය:

යම් රක්ෂණ ආවරණයක් ලබාදීම මගින් හෝ යම් හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීම මගින් හෝ ප්‍රතිලාභයක් ලබාදීම මගින් එකසත් ජාතීන්ගේ යෝජනා සම්මත යටතේ හෝ යුරෝපා සංගමයේ හෝ එක්සත් රාජධානියේ හෝ ඇමරිකා එක්සත් ජනපදයේ වෙළඳ හෝ ආර්ථික සම්බාධකවලට රක්ෂණ සමාගම යටත් වනතාක් දුරට මෙම රක්ෂණ ඔප්පුව යටතේ රක්ෂණ සමාගම විසින් ආවරණය ලබා දෙන බවට හෝ රක්ෂණ සමාගම හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීමට යටත් වන බවට හෝ යම් ප්‍රතිලාභයක් ලබා දෙන බව සලකනු නොලැබිය යුතුය.

# කොන්දේසි.

## 1. හිමිකම්පෑම්:

i. යම් හදිසි අනතුරක් හෝ පාඩුවක් සිදු වීමේදී ඔබ විසින් වහාම ඒ පිළිබඳව රක්ෂණ සහතිකයේ සඳහන් ඇමතුම් මධ්‍යස්ථාන අංකයට ඇමතුමක් ලබා දී අපට දැනුම් දිය යුතුය. යම් ලිපියක්, හිමිකම්පෑමක්, රිට් බලපත්‍රයක් හෝ සිතාසි ඔබ විසින් වහාම අපට භාර දිය යුතුය. ඔබේ වාහනයට අදාළ යම් අනතුරක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් පවතින නඩු කටයුත්තක් පිළිබඳව ඔබ විසින් වහාම අපට දැනුම් දිය යුතුය.

   ඔබේ වාහනය සොරකම් කළහොත් හෝ ඔබේ වාහනය හා සම්බන්ධ වෙනත් සාපරාධී ක්‍රියාවක් සිදුවුවහොත් ඒ පිළිබඳව වහාම පොලීසියට දැනුම් දිය යුතු අතර වැරදි කළ පුද්ගලයා වරදකරු කරවීම සඳහා ඔබ විසින් අපට ඔබේ සහයෝගය ලබා දිය යුතුය.

ii. යම් අනතුරක් සිදු වූ විට අපගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව ඔබ විසින් වාහනයේ කොටසක් ගැලවීම හෝ වාහන අළුත්වැඩියා කිරීමේ වැඩ ආරම්භ කිරීම නොකල යුතුය.

iii. (අ) අපගේ පූර්ව ලිඛිත අනුමැතිය ඔබ විසින් මුදල් ගෙවීමට ඉදිරිපත් වීම හෝ පොරොන්දුවීම හෝ මුදල් ගෙවීම නොකල යුතු අතර වරද පිළිගැනීමක්ද නොකළ යුතුය. යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් විත්ති වාචක ඉදිරිපත් කිරීම හෝ සමථයකට පත්වීම අපගේ අභිමතය පරිදී අප විසින් ඔබගේ නමින් සිදුකරනු ලබන අතර යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් නඩු පැවරීමද අප විසින් ඔබගේ නමින් ඉටු කරනු ඇත. එම නඩු කටයුතු පවත්වාගෙන යාමේදී යම් හිමිකම්පෑමක් පිළිබඳ සමථයකට එළඹීමේදී අප අපගේ සම්පූර්ණ අභිමතය පරිදී කටයුතු කරන අතර අපට අවශ්‍ය සියලූ තොරතුරු සහ සහය ඔබ විසින් අපට ලබා දිය යුතුය.

   (ආ) යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන යම් සිදුවීමකට පසුව කවර හෝ අවස්ථාවකදී (පෞද්ගලික කාර් සම්බන්ධයෙන් හැර) 3 වන පාර්ශවයේ දේපල හිමිකම්පෑමක් සඳහා අපගේ සම්පූර්ණ බැරකම ඔබට ගෙවනු ලබන අතර විත්ති වාචක ඉදිරිපත් කිරීම, සමථයකට පත් කිරීම හෝ නඩු කටයුතු පවත්වාගෙනයාම යන කරුණුවලින් අප ඉවත් වන්නෙමු. එම විත්ති වාචක පිළිබඳ හෝ සමථයකට පත්කිරීම හෝ නඩු කටයුතු පිළිබඳව අප විසින් උද්දේශිත පරිදී සිදු

කරන ලද ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් ඔබට සිදු වූ යම් හානියක් සම්බන්ධයෙන් හෝ එම ක්‍රියාවලින් අප ඉවත් වීම සම්බන්ධයෙන් ඔබ හෝ වෙනත් හිමිකම්පාන්නකු විසින් දරන ලද වියදමක් සම්බන්ධයෙන් අප වගකියනු නොලැබේ.

(ඇ) යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් සිද්ධිමය කරුණු සෙවීමේ ක්‍රියාදාමයකදී ඔබ විසින් අපට හෝ අපගේ බලයලත් නියෝජිතයන්ට සහය ලබාදී ආධාර කළ යුතුය.

(ඈ) යම් මාර්ග අනතුරක් හෝ පාඩුවක් සිදු වී දින හැටක් (60) ඇතුළත ඔබ විසින් ඔබගේ හිමිකම්පෑම සම්බන්ධයෙන් වන සියලූ අවශ්‍යතා සපුරා වාහනයට අලූත්වැඩියා කිරීම් සිදුකර පරීක්ෂා කිරීම සඳහා වාහනය ඉදිරිපත් කළ යුතුය.

ඉහත කී කාල සීමාවට දීර්ඝ කිරීමක් සලකා බලනු ලබන්නේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත වන අතර එය අපගේ ලිඛිත කැමැත්තට යටත් වේ.

iv. යම් හදිසි අනතුරක් හෝ පාඩුවක් සිදුවීමේදී උපලේඛනයේ සඳහන් ඔබේ  වාහනය හෝ එහි උපාංග හෝ අමතර කොටස් අප විසින් අළුත්වැඩියා කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ ඒ වෙනුවට වෙනත් උපාංග හෝ අමතර කොටස් ලබාදීම සිදු කරනු ලබන අතර ඒ සඳහා මුදල් ගෙවීමද කරනු ලැබේ. එම හදිසි අනතුර හෝ පාඩුව සිදුවූ අවස්ථාවේදී අපගේ වගකීම වාහනයේ ඇත්ත වශයෙන් වටිනාකමට හෝ අලාභ සිදු වූ හෝ නැති වූ අමතර කොටස් හෝ උපාංග වල වටිනාකමට සහ ඒවා සවි කිරීමේදී සාධාරණ වියදමකට සීමාවන නමුත් එම වගකීම, වාහනය රක්ෂණය කර ඇති මුදල සහ මාර්ග අනතුර හෝ පාඩුව සිදු වූ අවස්ථාවේදී වාහනයේ වෙළඳපල වටිනාකම යන මුදල් ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදල නොඉක්මවිය යුතුය.

එම අමතර කොටස් හෝ උපාංග ශ්‍රී ලංකාවේදී ලබා ගැනීමට නොහැකි නම් පහත දැක්වෙන කරුණුවලට යටත්ව අප විසින් මුදල් ගෙවනු ලැබේ. එම කරුණු මෙසේය.

(අ)

i. රක්ෂණ ඔප්පුවේ පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදී ඔබ විසින් දැරිය යුතු මිලේ ප්‍රතිශතයට යටත්ව , වාහනයේ නිෂ්පාදකයා හෝ නිෂ්පාදකයාගේ දේශීය නියෝජිතයා විසින් නිකුත් කරන ලද අලූත්ම කැටලොග් පොතේ හෝ මිල ලැයිස්තුවේ සඳහන් මිල:

ii. කැටලොග් පොතක් හෝ මිල ලැයිස්තුවක් නොමැති විට නිෂ්පාදකයාගේ වැඩපොළෙන් ලබාගත් මිල ලැයිස්තුවේ මිල සහ (ගුවනින් ගෙන්වීම හැර) සාධාරණ ප්‍රවාහන ගාස්තු සහ ආනයන බදු:

(ආ) එම අමතර කොටස් හෝ උපාංග වාහනයට සවි කිරීමේ සාධාරණ ගාස්තු:

v. සී.වී. (C.V.) ජොයින්ට්, බූට් කවර, බ්‍රේක්පෑඩ්, ලයිනර්, සෙන්සර්, ක්ලච් සහ ප්‍රෙෂර් ප්ලේට් ,මාස්ටර් පොම්පර්, රිපෙයාර් කිට් (බ්‍රේක් සහ ක්ලච්), තෙල්, ගෑස, ෆිල්ටර්, ගෑස් කට්, බෙල්ට්ස්, බ්‍රේක් වොෂර්, ඔයිල් රින්ග්ස්, ඔයිල් සීල් වෙනත් ඇසුරුම් රබර් අයිතම සහ වෙනත් පාරිභෝගික අයිතමයන් යන උපකරණ වෙනුවට එම කොටස් අලූතින් යෙදීමේ වියදමින් 50%ක් අප විසින් ගෙවනු ලැබේ.

vi. ඔබේ වාහනය සම්බන්ධයෙන් අනතුරක සිදුවන අවස්ථාවේදී ඔබ හෝ ඔබේ බලයලත් රියදුරා විසින් මෝටර් රථ පනතේ විධිවිධාන ප්‍රකාරව අනතුර හෝ පාඩුව පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට දැනුම් දිය යුතුය.

## 2. සාමාන්‍ය පිළිබඳ කොන්දේසිය:

අනතුරක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවේදී ඔබේ වාහනයේ වෙළඳපොල වටිනාකම රක්ෂණය කරන ලද මුදලට වඩා වැඩි නම්, ඔබගේ හිමිකම්පෑම ප්‍රමාණානුකූල මුදලකින් අඩු කරනු ලැබේ. ඔබට වාහන එකකට වැඩි සංඛ්‍යාවක් ඇත්නම් , එක් එක් වාහනය වෙන් වශයෙන් මේ කොන්දේසියට යටත් කරනු ලැබේ. වාහනයක වෙළඳපොල වටිනාකම යනු එම මොඩලයේ සහ එම වයසේ සහ එම තත්වයේ පවතින එම වර්ගයේම වාහනයක වෙළඳපොල වටිනාකම වේ.

## 3. සාධාරණ පූර්ව ආරක්ෂාව, නිසි පරිදි නඩත්තු කිරීම සහ පාඩු අවම කිරීම:

යම් පාඩුවක් හෝ අලාභයක් සිදුවීම වළක්වා ඔබගේ වාහනය ආරක්ෂා කර ගැනීමට ඔබ විසින් සියලූ සාධාරණ පූර්ව ආරක්ෂක කටයුතු සිදු කළ යුතු අතර ඔබගේ වාහනය කාර්යක්ෂම සහ මාර්ගයේ ගමන් කිරීමට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යා යුතුය. ඔබගේ වාහනය ,ඔබේ රියදුරන්, සේවානියුක්තයන් කවර හෝ අවස්ථාවකදි පරීක්ෂා කිරීමට අපට නිදහස හා සම්පූර්ණ ප්‍රවේශය තිබිය යුතුය. යම් හදිසි අනතුරක් හෝ වාහනය ක්‍රියාවිරහිත වීමක් සිදුවුවහොත් ඔබ වාහනය ළඟ කිසිවකු නොතබා එම ස්ථානයෙන් පිටත්ව නොයා යුතු අතර තව දුරටත් පාඩු හෝ අලාභ සිදුවීම වැළැක්වීමට පූර්වාරක්ෂිත ක්‍රියාමාර්ග ගත යුතුය. අවශ්‍ය අළුත්වැඩියා කිරීම් සිදුකිරීමට පෙර ඔබේ වාහනය පදවාගෙන ගියහොත් ඔබේ වාහනයට තවදුරටත් සිදුවන පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් හෝ ඔබේ වාහනයට අදාලව සිදු වන පාඩු අලාභ සම්බන්ධයෙන් අප වග කියනු නොලැබේ.

## 4. අවලංගු කිරීම:

ඔබ අවසන් වරට පදිංචිව සිටි බවට දැනුවත්ව ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දින 7ක් දැනුම්දීමක් සිදු කිරීමෙන් පසුව, අපට ඔබගේ රක්ෂණ ඔප්පුව අවලංගු කළ හැකි අතර රක්ෂණ ඔප්පුවේ අවසන් නොවූ කාලය සඳහා අප විසින් ඔබට අනුපාතිකව රක්ෂණ වාරිකයක් ආපසු ගෙවනු ලැබේ. ඔබ විසින්ද අපට දින 7ක දැන්වීමක් ලබාදි කවර හෝ අවස්ථාවකදී රක්ෂණ ඔප්පුව අවලංගු කර හැකි අතර වර්තමාන කාල සීමාව සඳහා හිමිකම්පෑමක් ඉදිරිපත් කර නැතිනම් උපචිත වී නැතිනම් රක්ෂණ ඔප්පුවේ ගෙවී ඇති කාල සීමාව සඳහා කෙටි කාලීන අනුපාතිකය අනුව රක්ෂණ වාරිකය අඩු කිරීමෙන් පසුව ඉතිරි රක්ෂණ වාරිකය ආපසු ගෙවනු ලබන අතර, පරිශිෂ්ඨය (Appendix) යටතේ දැක්වෙන වගුවේ දක්වා ඇති පරිදි එකී ගෙවීම් කෙටි කාලීන ආපසු ගෙවීමේ අනුපාතිකයන් අනුව සිදුකරනු ලැබේ.

## 5. වෙනත් රක්ෂණ:

ඔබේ වාහනයට අදාල හිමිකම්පෑම ආවරණය වන වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් තිබේ නම්, යම් පාඩුවක හෝ අලාභයක අනුප්‍රමාණ මුදලක් පමණක් අප විසින් ඔබට ගෙවනු ලැබේ. මෙම රක්ෂණ ඔප්පුවේ 2 වන වගන්තියේ 3 (ස) උප වගන්තිය යටතේ බැහැර කර ඇති යම් බැරකමක් සම්බන්ධයෙන් මෙම කොන්දේසිය අදාල නොවේ.

## 6. බේරුම් කිරීම:

i. මෙම රක්ෂණ ඔප්පුව යටතේ ගෙවිය යුතු පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් වූ මුදල් ප්‍රමාණය සමබන්ධයෙන් යම් ආරවුලක් හෝ මතභේදයක් ඇති වුවහොත්, මෙහි විධිවිධාන සලසා ඇති පරිදී ලිඛිත දැන්වීමක් මගින් වෙනත් ප්‍රශ්නවලට පරිභාහිරව එම ආරවුල බේරුම් කිරීම සඳහා යොමු කරනු ලැබිය යුතුය.

ii. එම ආරවුල හෝ මතභේදය යොමු කරන පාර්ශවය විසින් (එනම් පළමු පාර්ශවය විසින්) ලිඛිත දැන්වීමෙහි තමා නම් කර ඇති බේරුම්කරුගේ නම සඳහන් කළ යුතු අතර (එනම් පළමු වන බේරුම්කරු) එම යොමුකිරීම සිදු කරන ලිඛිත දැන්වීම අනෙක් පාර්ශවය වෙත (අනෙක් පාර්ශවය) යවනු ලැබිය යුතු අතර තවත් බේරුම්කරුවකු පත් කරන ලෙස අනෙක් පාර්ශවයෙන් ඉල්ලා සිටිය යුතුය.

iii. ඉහත කී ලිඛිත දැන්විම යවා දින තිහක් (30) ඇතුලත තවත් බේරුම්කරුවකු (දෙවන බේරුම්කරු) පත් කිරීම අනෙක් පාර්ශවය විසින් පැහැර හරින්නේ නම් පළමුවන බේරුම්කරු තනි බේරුම්කරු වශයෙන් කටයුතු කරමින් තන් බේරුම්කරු ලෙස ක්‍රියා කිරීමට මෙහි පාර්ශවයන් විසින් ඔහු ඒකාබද්ධව පත් කරනු ලැබ ඇති ලෙස සලකා එම බේරුම්කරු විසින් අවසාන ප්‍රදානයක් කළ යුතුය.

එම දැන්වීම යැවූ දිනය යන්නෙන් එම දැන්වීම ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබූ දිනය අදහස් වන අතර තැපැල් මුද්‍රාව හෝ ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය එම ලිපිය යැවූ බවට වූ අවසානාත්මක සාක්ෂියක් විය යුතුය.

අනෙක් පාර්ශවය විසින් දෙවන බේරුම්කරුවකු පත කරනු ලැබුවහොත් දෙවන බේරුම්කරු පත් කිරීමේ දින සිට දින විස්සක් (20) ඇතුළත එම බේරුම්කරුවන් දෙදෙනා විසින් ශ්‍රී ලංකාවේ 1995 අංක 11 දරන බේරුම්කිරීමේ පනතේ 6(3) වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදී සභාපතිවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර එම සභාපතිවරයා පළමුවන හා දෙවන බේරුම්කරුවන් දෙදෙනා සමග එක්ව පවත්වන රැස්වීම්වලදී මුලසුන දැරිය යුතුය.

iv. ඉල්ලා අස්වීම හෝ මියයාම හෝ වෙනත් හේතුවක් නිසා බේරුම්කරුවකුගේ පුරප්පාඩුවක් ඇති වුවහොත්, එම පුරප්පාඩුව ඇති වන දින සිට දින 21ක් ඇතුලත හෝ පුරප්පාඩු වූ බේරුම්කරුගේ දිනයට තවත් බේරුම්කරුවන් පත් කරන ලෙස ඉල්ලා සිටිමින් අනෙක් පාර්ශවය විසින් ලිඛිත දැන්වීමක් එවන ලද දිනයේ සිට දින 21ක් ඇතුලත යන දින දෙකෙන් පසුව එළැඹෙන දිනය දක්වා වු කාලය ඇතුළත තවත් බේරුම්කරුවකු පත් කරනු ලැබිය යුතුය. එක් පාර්ශවයක් විසින් යවන ලද ලිඛිත දැන්වීමකට පසුව  අනෙක් පාර්ශවය පුරප්පාඩුව පිරවීම සඳහා බේරුම්කරුවකු පත් කිරීම පැහැර හරින අවස්ථාවක , ඉතිරි බේරුම්කරු සහ

සභාපතිවරයා බේරුම්කිරීමේ නඩු කටයුතු අවසන් කළයුතු අතර පුරප්පාඩු වූ බේරුම්කාර තනතුර සඳහා බේරුම්කරුවකු පත් කිරීමට අපොහොසත් වූ පාර්ශවකරු බේරුම් කිරීම සඳහා මුලින් යොමු කල ආරවුල හෝ මතභේදය සම්බන්ධයෙන් ඉන් ඉදිරියට තරග නොකල යුතුය. සභාපතිධුරය පුරප්පාඩු වුවහොත් එසේ පුරප්පාඩු වන දින සිට දින 21ක් ඇතුලත බේරුම්කරුවන් දෙදෙනා විසින් නව සභාපතිවරයකු පත් කරනු ලැබිය යුතුය.

v. ඉහත කී පරිදී මෙම රක්ෂණ ඔප්පුව යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක් හෝ මතභේදයක් එම ආරවුල හෝ මතභේදය ඇති වී ලිත් මාස දොළහක් (12) ඇතුලත එම ආරවුල හෝ මතභේදය බේරුම්කිරීම සඳහා යොමු නොකළහොත් රක්ෂණ සමාගම විසින් තීරණය කරන ලද මුදල් ප්‍රමාණය බලපැවැත්විය යුතුය.

vi. බේරුම්කිරීමේ නඩු කටයුතු කොළඹ නගරය තුලදී පැවැත්විය යුතු අතර බේරුම් කිරීමේ නඩු කටයුතු වල භාෂාව ඉංග්‍රීසි භාෂාව විය යුතුය. පාර්ශවයන් අතර අන්‍යාකාරයකට එකග වුවහොත් මිස, බේරුම්කිරීම සඳහා වූ කාර්යපටිපාටිය, බේරුම්කිරීමේ ගිවිසුම සමග පරස්පර නොවනතාක් දුරට එම කාර්යපටිපාටිය පනතේ සඳහන් කාර්යපටිපාටිය විය යුතුය. පනත සහ මෙම බේරුම්කිරීමේ ගිවිසුම අතර මත ගැටුමක ඇත්නම් මෙම බේරුම්කිරීමේ ගිවිසුමේ සඳහන් විධිවිධාන පනතේ විධිවිධාන අභිබවා බලාත්මක විය යුතුය.

vii. මෙහි විධිවිධාන සලසා ඇති පරිදී පවත්වන ලද බේරුම් කිරීමකදී කරන ලද බේරුම් කිරීමේ තීරණයක් අවසාන හා තීරණාත්මක විය යුතු අතර එම බේරුම්කාර තීරණය මගින් මෙහි පාර්ශවයන් බැඳී සිටිය යුතුය.

viii. එක් එක් පාර්ශවය විසින් පත් කරන ලද බේරුම්කරුගේ වියදම එම බේරුම්කරු පත් කළ පාර්ශවය විසින් දරනු ලැබිය යුතු අතර සභාපතිවරයාගේ වියදම් සහ අනෙක් පරිපාලන වියදම් පාර්ශවයන් දෙක අතර සමානව බෙදාගෙන දැරිය යුතුය. තනි බේරුම්කරුවකු පමණක් සිටින අවස්ථාවක එම තනි බේරුම්කරුගේ වියදම් පාර්ශවයන් දෙක විසින් සමානව දරා සිටිය යුතුය.

## 7. වෙනස් කිරීම හෝ නවීකරණය කිරීම:

අපගේ වගකීමට සැලකිය යුතු පරිදි බලපාන ලෙස ඔබගේ වාහනයට කරන ලද යම් වෙනසක් පිළිබඳව හෝ නවීකරණය කිරීමක් පිළිබඳව හෝ විශේෂ කොටසක් සවිකිරීම පිළිබඳව ඔබ විසින් අපට දැනුම් දිය යුතු අතර එය පරීක්ෂා කිරීමෙන් පසු තවදුරටත් නියම, කොන්දේසි ව්‍යාතිරේක පැනවීමට අපට හිමිකමක් ඇත .

## 8. නියම හා කොන්දේසි පිළිපැදීම:

ඔබගේ රක්ෂණ ඔප්පුවේ, උපලේඛනයේ සහ රක්ෂණ සහතිකයේ සඳහන් සියලු නියම, කොන්දේසි සහ වගන්ති ඔබ විසින් නියමිත පරිදි පිළිපැදීම සහ සපුරාලීමද යෝජනා ආකෘති පත්‍රයේ සඳහන් ප්‍රකාශවල සහ උත්තරවල සත්‍යභාවයද හිමිකම්පෑමක් මගින් ඔබ ලබාදී ඇති ප්‍රකාශ හෝ ලේඛනවල අංගසම්පූර්ණ බව සහ එම තොරතුරුවල නිවැරදිභාවය යන කරුණු ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ ගෙවීමක් කිරීමට පෙර අපට ඇති වගකීමට කලින් ඉටු විය යුතු කොන්දේසි වේ.

## 9. වංචනික හිමිකම්පෑම්:

ඔබගේ හිමිකම්පෑම් යම් ආකාරයකින් වංචනික නම් හෝ ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඔබ හෝ ඔබ වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තකු වංචනික ක්‍රියාමාර්ග, උපක්‍රම හෝ ලේඛන භාවිත කරන්නේ නම් හෝ යම් පාඩුවක් හෝ අලාභයක් සිදුකිරීමට ඔබ වෙනත් තැනැත්තකු සමග වංක සහයෝගයෙන් සිතාමතා ක්‍රියාකරන්නේ නම් හෝ ඔබේ හිමිකම්පෑම සනාථ කිරීම සඳහා ඔබ අසත්‍ය ප්‍රකාශන හෝ ප්‍රකාශ ඉදිරිපත් කරන්නේනම් එවිට ඔබගේ රක්ෂණ ඔප්පුවේ සියලු ප්‍රතිලාභ අවලංගු වන්නේය.

## 10. හිමිකම් නොපෑමේදී ලැබෙන වාර්ෂික ප්‍රසාද දීමනාව (No claim bonus):

රක්ෂණ කාලය තුළදී ඔබ විසින් යම් හිමිකම්පෑමක් ඉදිරිපත් නොකළේ නම්, ඔබ රක්ෂණය අලුත් කරන ගාස්තුව පහත දැක්වෙන ආකාරයට අඩුකරනු ලැබේ.

**මෝටර් සයිකල් සහ වෙළඳ අංක තහඩු හැර (Trade Plate)**

| කාල සීමාව | අදාළ වන ප්‍රතිශතය |
|---|---|
| කලින් වර්ෂය | 15% |
| කලින් වර්ෂය 2 | 25% |
| කලින් වර්ෂය 3 | 35% |
| කලින් වර්ෂය 4 | 45% |
| කලින් වර්ෂය 5 | 55% |
| කලින් වර්ෂය 6 | 60% |
| කලින් වර්ෂය 7 | 65% |
| කලින් වර්ෂය 8 | 70%( උපරිම) |

**මෝටර් සයිකල් සඳහා**

| | |
|---|---|
| කලින් වර්ෂය | 15% |
| කලින් වර්ෂය 2 | 20% |
| කලින් වර්ෂය 3 | 25% |
| කලින් වර්ෂය 4 | 30% |
| කලින් වර්ෂය 5 | 35% (උපරිම) |

කෙසේ වුවද හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමේදී හිමිකම් ලබා නොගැනීමේ පාරිතෝෂිකය කලින් වූ වර්ෂයට අදාල ප්‍රතිශතය දක්වා පහත වැටේ.එකම රක්ෂණ කාලසීමාවක් තුළ හිමිකම්පෑම් එකකට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කලහොත් ඔබගේ හිමිකම් ලබා නොගැනීමේ ප්‍රසාද දීමනාව එම ආකාරයටම තවදුරටත් අඩු වේ.

ඔබේ වාහනයේ අයිතිය පැවරීමක් සිදුවුවහොත් හෝ වාහනය විකුණනු ලැබුවහොත් ඔබ උපයාගත් හිමිකම් ලබා නොගැනීමේ ප්‍රසාද දීමනාව ඔබ වෙත නොවෙනස්ව පවතී. ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ වාහන එකකට වැඩි ප්‍රමාණයක් ආවරණය වන්නේ නම්,එක් එක් වාහනය සම්බන්ධයෙන් වෙන් වශයෙන් වූ රක්ෂණ ඔප්පුවක් නිකුත් කර ඇති ලෙස සලකා එක් එක් වාහනය සම්බන්ධයෙන් හිමිකම් ලබා නොගැනීමේ ප්‍රසාද දීමනාව අදාල විය යුතුය.

## 11. ඇතැම් නියමයන් මගහැරීම සහ මුදල් අයකර ගැනීමට ඇති අයිතිය:

1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 102 සහ 105 යන වගන්ති වල විධිවිධාන යටතේ සහ ඒවා ප්‍රකාරව යම් මුදලක් අය කර ගැනීමට මෙම රක්ෂණ ඔප්පුව මගින් හානිපූර්ණ කර ඇති යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුට ඇති අයිතියකට මෙම රක්ෂණ ඔප්පුව හෝ මෙහි අන්තර්ගත යම් වගන්තියක් අහිතකර ලෙස බලනොපෑ යුතුය.

නමුත් මෙම වගන්තිය නොතිබුනේ නම් අප ගෙවීමට යටත් නොවන යම් මුදලක් ඔබ විසින් අපට ආපසු ගෙවනු ලැබිය යුතුය.

## 12. හානිපූර්ණය කිරීමේ සීමා අදාළ කර ගැනීම :

එක් තැනැත්තකුට වැඩි පිරිසකට හානි පූර්ණය කිරීමට සිදුවන හදිසි අනතුරක් සිදුවීමේදී සම්පූර්ණ හානිපූර්ණ මුදල ඔබේ රක්ෂණ ඔප්පුව අපේ වගකීමේ සීමාව නොඉක්මවිය යුතු අතර එවැනි අවස්ථාවකදී අප විසින් ඔබට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

## 13. අධිකරණ බලය:

මෙම රක්ෂණ ඔප්පුව මගින් සලසා ඇති හානිපූර්ණය ශ්‍රී ලංකාවේ නිසි අධිකරණ බලය ඇති අධිකරණයන් විසින් පළමු අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරන ලද හෝ එවැනි අධිකරණයකින් පළමු අවස්ථාවේදී ලබා ගත් නඩු තීන්දු සම්බන්ධයෙන් හෝ අන්‍යෝන්‍ය ගිවිසුම් මගින් අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාවෙන් පිටතදී ලබා ගත් නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නොවිය යුතුය.

# අතිරේක වගන්ති

ඔබගේ රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ සඳහන් කර ඇත්නම් පමණක් පහත දැක්වෙන වගන්ති අදාල වේ.

## 1. කුලී සින්නක්කර / කල්බදු ගිවිසුම :

ඔබේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආයතනය සමග ඔබේ වාහනය කුලී සින්නක්කර /කල්බදු ගිවිසුමකට යටත්කර ඇත්නම් , එම ආයතනය එම වාහනයේ අයිතිකරු ලෙස අප විසින් සලකනු ලබන අතර යම් අනතුරක් හෝ පාඩුවක් අලුත්වැඩියා කිරීම මගින් ප්‍රතිෂ්ඨාපනය කිරීම මගින් හෝ ඒ වෙනුවට අලුතින් ආදේශ කිරීම මගින් පිළියම්කල නොහැකි නම් එම හිමිකම්පෑම එම ආයතනයට ගෙවනු ලබන අතර ඔවුන් එම මුදල ලබා ගැනීම සම්පූර්ණ සහ අවසාන වශයෙන් අප නිදහස් කිරීමක් වන්නේය. තවද මෙම වගන්තිය මගින් ප්‍රකාශිතව එකඟ වී ඇති කරුණු සඳහා හැර ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ ඔබේ යම් අයිතියකට හෝ බැරකමකට නැතහොත් අපගේ යම් අයිතියකට හෝ බැරකමකට මෙම වගන්තිය මගින් අහිතකර බලපෑමක් සිදු නොවේ.

## 2. ස්වෙච්ඡා අතිරික්තය :

ඔබගේ රක්ෂණ ඔප්පුවේ ඇති වෙනත් යම් අතිරික්තයක් නොතකා ඔබේ වාහනය සම්බන්ධයෙන් වූ එක් එක් සහ සෑම හිමිකම්පෑමක් ඇති වෙනස් කල පාඩුවෙන් මෙහි උපලේඛනයේ සඳහන් ස්වෙච්ඡා අතිරික්තය ඔබ විසින් දැරිය යුතුය.

## 3. පෞද්ගලික අනතුරු ප්‍රතිලාභ :

අදාළ අතිරේක රක්ෂණ වාරිකයට යටත්ව, ඔබගේ වාහනයට නගින අතරතුර හෝ ඉන් බැස යන විට හෝ වාහනයේ ගමන් කරන විට ඔබේ රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වී ඇති තැනැත්තකුට යම් හේතුවකට පරිභාහිරව, ප්‍රචණ්ඩ අනතුරුදායක බාහිර සහ දෘශ්‍ය ක්‍රමයකින් සිදු වන පුද්ගලයකුගේ මරණය හෝ ශාරීරික තුවාල සිදුවීම් සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති පරිමාණය ප්‍රකාරව අප විසින් වන්දි ගෙවනු ලැබේ. (එම තුවාල සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය හෝ ශල්‍ය කර්ම වියදම් හැර) මරණය හෝ ශාරීරික තුවාල අනතුරු සිදු වී දින එකසිය අසූවක් (180) ඇතුලත සිදු වී තිබිය යුතුය.

**වන්දි ගෙවීමේ ප්‍රමාණය :**

(උපලේඛනයේ ප්‍රධාන පංතිය යටතේ පෞද්ගලික අනතුරු ආවරණය යටතේ වන සීමාව මත අදාල වේ.)

| | |
|---|---|
| 1. මරණය | 100% |
| 2. සම්පූර්ණ ඇස් දෙකේම පෙනීම නැති වීම සහ ඊට පිළියම්කල නොහැකි වීම අත් දෙකේම මැණික්කටුව ලගින් වෙන්වීම හෝ කකුල් දෙකේම වළලුකර ලගින් වෙන්වීම හෝ එක අතක් සහ එක කකුලක් නැති වීම. | 100% |
| 3. අතේ මැණික් කටුව ලගින් හෝ කකුලේ වළලු කර ලගින් වෙන් වීම සහ නැවත සුව කල නොහැකි පරිදී එක් ඇසක පෙනීම සම්පූර්ණයෙන් නැති වීම. | 100% |
| 4. එක් අතක මැණික්කටුව ලගින් වෙන්වීම හො එක් කකුලක වළලු කරලගින් වෙන් වීම හෝ නැවත සුව කළ නොහැකි පරිදී එක් ඇසක පෙනීම සම්පූර්ණයෙන් නැති වීම. | 50% |
| 5. ඔබේ ව්‍යාපාරය හෝ කවර හෝ වර්ගයක රැකියාව කරගෙන යාම වළක්වාලමින් තාවකාලික සම්පූර්ණ ශාරීරික අබලතාව | සතියකට 0.5% බැගින් සති 26ක් දක්වා |

(අ) එක අනතුරක් සම්බන්ධයෙන් එක් තැනැත්තකුට ඉහත පරිමාණයේ සඳහන් එක අයිත්මයන් යටතේ පමණක් අප විසින් වන්දි ගෙවනු ලබන අතර අපගේ සම්පූර්ණ වගකීම ඔබේ උපලේඛනයේ සඳහන් මුදල නොයික්මවිය යුතුය.

(ආ) පහත දැක්වෙන අවස්ථා වල ප්‍රතිපලයක් වශයෙන් සිදු වන යම් මරණයක් හෝ ශාරීරික තුවාල සඳහා අප විසින් වන්දි මුදල් ගෙවනු නොලැබේඃ

i. තමා විසින්ම තමාට තුවාල සිදුකර ගැනීම, සියදිවි නසා ගැනීම , හෝ සිය දිවි නසා ගැනීමට තැත්කිරීම හෝ ශාරීරික දුබලතාවයක් හෝ අශක්නුතාවයක් නිසාඃ

ii. මත් පැන් හෝ මත් ද්‍රව්‍ය හෝ වෙනත් මත් වන ද්‍රව්‍යක් කවර ආකාරයකින් හෝ පානය කරමින් සිටින අතරතුර හෝ පානය කිරීමෙන් පසු යම් තැනැත්තකුට සිදුවූ අනතුරක් සම්බන්ධයෙන්ඃ

(ඇ) ඔබගේ අනුමැතිය නැතිව අප විසින් වන්දි මුදල් ඍජුවම තුවාල වූ තැනැත්තාට හෝ ඔහුගේ නීති නියෝජිත්යාට ගෙවනු ලැබේ. ඔවුන් එකී මුදල් ලැබීම මගින් අප සම්පූර්ණ සහ අවසාන වශයෙන් නිදහස් කර ඇති ලෙස අප සලකන්නෙමු.(මෙය අදාළ වනුයේ වාහනයක ගමන් කරන මගීන්ට, නම් කරන ලද පුද්ගලයන්ට සහ වැටුප් ගෙවන රියදුරාට පමණකි)

(ඈ) ඔබේ ලියාපදිංචි සහතිකයේ අවසර දී ඇති පුද්ගලයන් සංඛ්‍යාවට වැඩි පුද්ගලයන් ප්‍රමාණයක් ඔබේ වාහනයේ රැගෙන නොයා යුතුය.

(ඉ) අනතුර සිදුවන අවස්ථාවේදී වයස අවුරුදු 16ට අඩු හෝ වයස අවුරුදු 65ට වැඩි තුවාල සිදු වූ පුද්ගලයන් සිටී නම්,අපි ඔවුන්ට වන්දි මුදල් නොගෙවමු.

(ඊ) වැඩ වර්ජන ,කැරලිකෝලාහළ ,සිවිල් අරගල හෝ ත්‍රස්තවාදී ක්‍රියාවලට ඔබේ රක්ෂණ ඔප්පුව මගින් ලබාදී ඇති ආවරණය සඳහා විශේෂයෙන් වැඩ පිළිවෙලක් සකසා ඇත්නම් මිස, එම අවස්ථාවලට මෙම ප්‍රතිලාභය අදාළ නොවේ.

(උ) සම්පූර්ණ වන්දි මුදල පිළිබඳව තීරණය කර එකඟ වූ පසු සතිපතා වන්දි මුදල් ගෙවනු ලැබේ.

## 4. මගීන්ගේ අවධානම (මගීන් සඳහා වන නීත්‍යානුකූල වගකීම) :

(වාණිජ වශයෙන් මගීන් රැගෙන යන වාහනවලට මෙය අදාළ වේ)

අතිරේක වාරික මුදලක් ගෙවීමට යටත්ව, ඔබේ වාහනයට ඇතුලු වන වාහනයෙන් බසින හෝ වාහනයේ රැගෙන යනු ලබන යම් මගියෙකුගේ මරණය සිදුවීම හෝ එම මගියාට ශාරීරික තුවාල සිදුවීම හේතුකොට ගෙන ඇති වන නෛතික වගකීම සම්බන්ධයෙන් ඔබේ රක්ෂණ ඔප්පුවේ 2 වන වගන්තිය යටතේ හානිපූර්ණය කර ඇති ඔබ හෝ වෙනත් යම් තැනැත්තකු අප විසින් ආවරණය කරනු ලැබේ. ගෙවනු ලබන උපරිම මුදල උපලේඛනයේ සඳහන් මුදලට සීමා වේ. ඔබේ වාහනයේ ලියාපදිංචි සහතිකය මගින් අවසරදී ඇති පුද්ගලයන් සංඛ්‍යාවට වඩා වැඩියෙන් පුද්ගලයන් ප්‍රමාණයක් ඔබේ වාහනයේ රැගෙන යන්නේ නම් අප විසින් ගෙවනු ලබන සම්පූර්ණ මුදලින් අනුපාතික කොටසක් ඔබ විසින් ගෙවනු ලැබිය යුතුය.

## 5. කම්කරු වන්දි රක්ෂණය :

අතිරේක රක්ෂණ වාරිකයක් ගෙවීමග්ට යටත්ව ඔබේ රක්ෂණ ඔප්පුව යටතේ රක්ෂණය කර ඇති වාහනවල සේවයේ යෙදී සිටින අතරතුර ඔබේ රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන වැටුප් ලබන රියදුරාට හෝ සේවකයාට හෝ පිරිසිදු කරන්නාට හෝ කම්කරුවාට සිදු වන පෞද්ගලික තුවාල සිදුවීමක් සඳහා මේ වගන්තිය යටතේ රක්ෂණ ආවරණය නිකුත් කිරීමේ දිනයට පෙර සම්මත කරන ලද 1934 කම්කරු වන්දි ආඥා පනත ප්‍රකාරව හෝ ඊට පසුව කරන ලද සංශෝධිත ප්‍රකාරව අප විසින් වන්දි මුදලක් ගෙවනු ලැබේ. අපගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමට යටත්ව ඔබ විසින් දරන ලද වෙනත් පිරිවැය සහ වියදම් අප විසින් ගෙවනු ලැබේ. එක් එක් රක්ෂණ ඔප්පු කාල සීමාව අවසානයේදී ඔබේ වාහනයට අදාලව එක් අවස්ථාවකදී ඔබ සේවයේ යොදවන උපරිම රියදුරන් සංඛ්‍යාව , සේවකයන් හා පිරිසිදු කරන්නන් හා කම්කරුවන් සංඛ්‍යාව ඔබ විසින් අපට ලබා දිය යුතු අතර අය කරනු ලබන අතිරේක වාරික ඒ අනුව වෙනස් කරනු ලැබේ.

කෙසේ වුවද-

i. ඔබගේ සාමාන්‍ය සේවකයන්ගේ වගකීම ආවරණය වන පරිදී ඔබ වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් දරන්නේ නම් හෝ වෙනත් යම් රක්ෂණ ඔප්පුවකට පසුව ඇතුලත් වී ඇත්නම් මෙම රක්ෂණ ඔප්පුව යටතේ ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම්පෑමකට අප විසින් මුදල් ගෙවනු නොලැබේ.

ii. පහත දැක්වෙන සිදුවීම්වල ප්‍රතිපලයක් ලෙස සිදුවන යම් මරණයක් සඳහා හෝ ශාරීරික තුවාල සිදුවීම් සඳහා අප විසින් වන්දි මුදල් ගෙවනු නොලැබේ.

(අ) තමා විසින්ම තමාට තුවාල සිදු කරගැනීම, සිය දිවි නසා ගැනීම හෝ සිය දිවි නසා ගැනීමට තැත් කිරීම හෝ ශාරීරික දුබලතාවයක් නිසා හෝ අශක්නුතාවක් නිසා.

(ආ) මත් පැන් හෝ මත් ද්‍රව්‍ය හෝ වෙනත් මත් වන ද්‍රව්‍යක් කවර හෝ ආකාරයකින් පානයකරමින් සිටින අතරතුර හෝ පානය කිරීමෙන් පසු යම් තැනැත්තකුට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන්ඃ

iii. මාර්ග අනතුරු හෝ පාඩු සිදු වීම වැළැක්වීම සඳහා ඔබ විසින් සියලූ පූර්වාරක්ෂක ක්‍රම අනුගමනය කළ යුතු අතර සියලූ ව්‍යවස්ථාපිත බැඳීම් වලට අනුකූලව ක්‍රියා කල යුතුය.

iv. ඔබ විසින් සේවයේ නියුක්ත කරවන ලද එක් එක් රියදුරා , සේවකයා , පිරිසිදු කරන්නා හා කම්කරුවා පිලිබඳ විස්තර ඇතිලත් වාර්තාවක් සහ ඔවුන්ගේ වේතන , වැටුප් සහ වෙනත් ගෙවීම් පිළිබඳ විස්තර ඔබ විසින් පවත්වාගෙන යා යුතු අතර කවර හෝ අවස්ථාවකදී එම වාර්තා පරික්ෂා කිරීමේ අවස්ථාව අපට ලබා දිය යුතුය.

v. මෙම ප්‍රතිලාභය සඳහා අයකරනු ලබන අතිරේක රක්ෂණ වාරිකය ඔබේ ලබා නොගැනීමේ පාරිතෝෂිකයට යටත් නොවේ.මෙම ප්‍රතිලාභය යටතේ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම් පෑමක් ඔබගේ හිමිකම් ලබා නොගැනීමේ පාරිතෝෂිකයට (බද ජක්සප ඉදබම්) අහිතකර බලපෑමක් සිදු නොවේ.

vi. ඔබේ ඉල්ලීම පරිදී ඔබේ රක්ෂණ ඔප්පුව අවලංගු කරනු ලැබුවහොත් මේ වගන්තිය සම්බන්ධයෙන් වූ රක්ෂණ වාරිකය ආපසු ගෙවීමක් සඳහා අවසර නොලැබේ.

vii. ඔබගේ සේවා නියුක්තයා හෝ ඔහුගේ යැපෙන්නන් අප ගෙවන වන්දි මුදල සම්පූර්ණ සමථයක් ලෙස භාර ගැනීමට එකඟ නම් අප විසින් එම වන්දි මුදල ගෙවනු ලැබේ. එසේ නොවන්නේ නම් ඔබට ඇති නෛතික වගකීම අප විසින් පොදු නීතිය යටටතේ ආවරණය කරනු ලබන අතර අපගේ ලිඛිත කැමැත්ත ලබා ගැනීමට යටත්ව දරන ලද වියදම් අප විසින් ගෙවනු ලැබේ.

viii. වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හෝ ත්‍රස්තවාදී ක්‍රියාවලට ඔබේ රක්ෂණ ඔප්පුව මගින් ලබාදී ඇති ආවරණය සඳහා විශේෂ වැඩපිළිවෙලක් සකසා ඇත්නම් මිස, එම අවස්ථා වලට මෙම ප්‍රතිලාභය අදාළ නොවේ.

## 6. ඇදගෙන යාමේ ගාස්තු / වියදම්

උපලේඛනයේ දක්වා ඇති පරිදි අමතර වාරිකයකට යටත්ව ඔබගේ රථය සඳහා වන ඇදගෙන යාමේ ගාස්තු / වියදම් පළමු වගන්තිය යටතේ ඇති සිව් වන උප වගන්තියේ සඳහන් පරිදි ඉහළ නංවා ඇත.

## 7. වින්ඩ්ස්ක්‍රීන් වීදුරු/ජනෙල් වීදුරු :

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව වාහනයේ බඳ කොටසට අලාභ හානි නොවී ඔබේ වාහනයේ වින්ඩ්ස්ක්‍රීන් වීදුරුව හෝ ජනෙල් වීදුරු කැඩී බිඳී ගියහොත්, අලාභ සිදුවීමේ හේතුව කුමක් වුවත් එම වීදුරු අලුතින් යෙදීමේ වියදම අප විසින් ගෙවනු ලැබේ. ඔබේ රක්ෂණ ඔප්පුවේ වැඩිම මුදල වශයෙන් කවර මුදලක් සඳහන් වුවද මෙම ප්‍රතිලාභය වශයෙන් ගෙවනු ලබන උපරිම මුදල උපලේඛනයේ සඳහන් මුදලට සීමා විය යුතුය. එකී මුදල ගෙවීම මගින් ඔබේ හිමිකම් ලබා නොගැනීමේ පාරිතෝෂිකයට (බඳ ජක්සප ඉදබම්) එමගින් අහිත්කර බලපෑමක් සිදු නොවිය යුතුය.

## 8. තුන් වන පාර්ශවයේ දේපල වලට සිදු වන අලාභ :

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව , ඔබේ වාහනය භාවිතකිරීමෙන් තුන් වන පාර්ශවයේ හිමිකම් පාන්නන්ට සිදු වූ පිරිවැය හා වියදම් ඇතුලූ තුන් වන පාර්ශවයේ දේපලවලට සිදුවන අලාභය සම්බන්ධයෙන් ඔබේ නෛතික වගකීම ඔබේ උපලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව අප විසින් ආවරණය කරනු ලැබේ.

## 9. පුහුණු වන රියදුරු/පුහුණු වන මෝටර් සයිකල් පදින්නා :

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව , පුහුණු වන රියදුරු/පුහුණු වන මෝටර් සයිකල් පදින්නා සම්බන්ධයෙන් ඔබ මෝටර් වාහන පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීමෙන් පසු උපලේඛනයේ සඳහන් ඔබේ වාහනය පැදවීමට ඉගෙන ගන්නා ඔබේ උපලේඛනයේ නම් කර ඇති තැනැත්තා ඔබේ වාහනය පදවන අතරතුර අපගේ රක්ෂණ ආවරණය ඔහුට අදාල කර ගැනීමට අප විසින් මේ රක්ෂණය ව්‍යාප්ත කරනු ලැබේ. අදාළ වෙනත් අතිරික්තයන්ට අමතරව එක් එකෙ හිමිකම්පෑමේ පළමු රු.2,500/- ඔබ විසින් දරනු ලැබිය යුතුය.

## 10. (නැවත අළුත්වැඩියා කරන ලද (reconditioned) වාහන සඳහා) අලූත්ම අමතර කොටස් ප්‍රතිපූර්ණය කිරීම)

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව, ඔබේ වාහනයට පාඩුවක් හෝ අලාභයක් සිදු වී අලූත්ම අමතර කොටස් යෙදීමට අවශ්‍ය වුවහොත් එම අලාභය සඳහා අලූත්ම අමතර කොටස් මිලදී ගැනීමේ වියදම අප විසින් ඔබට ගෙවනු ලැබේ.

## 11. ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ ඒකාබද්ධව කුලියක් සඳහා මගී ප්‍රවාහන බස් රථ ධාවනය කිරීම :

අතිරේක රක්ෂණ මුදලක් ගෙවීමට යටත්ව ඔබේ රක්ෂණ ඔප්පුවේ 2 වන වගන්තියේ 1(iii) උප වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුවද ඔබේ රක්ෂණ ඔප්පුව යටතේ රක්ෂණය කරන ලද වාහනයට නගින විට හෝ වාහනයෙන් බසින විට හෝ වාහනයේ ගමන් කරන විට යම් මගියෙකුගේ මරණය සිදු වීම සම්බන්ධයෙන් හෝ යම් මගියෙකුට ශාරීරික තුවාල සිදුවීම සම්බන්ධයෙන් එම හිමිකම් පාන්නාගේ පිරිවැය හා වියදම් ඇතුලූ ඔබේ නෛතික වගකීම අප විසින් ආවරණය කරනු ලැබේ.

එහෙත් අනතුර සිදු වන අවස්ථාවේදී ඔබේ වාහනයේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් ආසන ගණනට වැඩියෙන් මගීන් ගමන් කලා නම්, අප විසින් ගෙවිය යුතු සම්පූර්ණ හිමිකම්පෑමේ මුදලින් අනුපාතික කොටසක් ඔබ විසින් ගෙවනු ලැබිය යුතුය.

තවද-

1. ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ රක්ෂණය කර ඇති වාහන වර්ගය පැදවීමට ඔබගේ එක් එක් රියදුරා යෝග්‍ය බවට ස්ථිර කරමින් ඔබගේ රියදුරන් සම්බන්ධයෙන් ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකයක් ඔබ විසින් අපට ඉදිරිපත් කළයුතු එම රියදුරන්ගේ රියදුරු පළපුරුද්ද අදාල පංතිය සම්බන්ධයෙන් අවුරුදු තුනකට (3) වැඩි විය යුතුය.

2. ඔබගේ රියදුරා වයස අවුරුදු 65කට අඩු පුද්ගලයෙකු විය යුතු අතර ඔබගේ වාහනය වයස අවුරුදු 30කට අඩු පුද්ගලයකු විසින් ධාවනය කරන්නේ නම්, ඔබගේ රක්ෂණ ඔප්පුව යටතේ වන වෙනත් අතිරික්තයකට අමතරව රු.1,000/-ක අතිරික්තයකට යටත් විය යුතුය.

3. ඔබගේ වාහනය පිටරටදී පාවිච්චි කල වාහනයක් නම් (Second hand) හෝ නැවත අලූත්වැඩියා කල වාහනයක් නම් (Reconditioned) වාහනයේ යෝග්‍යතාව ස්ථිර කරන හෝ එය මහා මාර්ගයේ ගමන් කිරීමට සුදුසු බව ස්ථිර කරන සහතිකයක් ඔබ විසින් වාහනයේ නිෂ්පාදකයාගෙන් හෝ ලංකා ඔටෝ මොබයිල් සංගමයෙන් ලබා ගත යුතුය.

## 12. කුලියට ලබා දෙන වාහන:

අතිරේක රක්ෂණ මුදලක් ගෙවීමට යටත්ව, ඔබේ වාහනය වෙනත් තැනැත්තකුට කුලියට දී ඇති විට (ප්‍රාථමික වශයෙන් කුලිය ගත් තැනැත්තා)හෝ වෙනත් තැනැත්තකුට කුලියට දීමට එම කුලියට ගත් තැනැත්තාට අවසර දෙන විට (ද්විතීය වශයෙන් කුලියට ගත් තැනැත්තා ) ඔබේ වාහනයට සිදුවන පාඩුවක් හෝ අලාභයක් ආවරණ කිරීමට ඔබේ රක්ෂණ ඔප්පුව දීර්ඝ කරනු ලැබේ.

i. ප්‍රථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා සමග ඔබ කුලියටදීමේ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. ප්‍රථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා මෙම රක්ෂණ ඔප්පුවට අමුණා ඇති නියමිත ආකෘති පත්‍රයෙන් යුක්ත වූ ප්‍රකාශයක් යථා පරිදී සම්පූරණ කර එය අත්සන් කල යුතු අතර එය ඔබගේ වාහනය කුලියට දීමේ ගිවිසුමේ කොටසක් විය යුතුය.

වාහනය තවත් තැනැත්තකුට නැවත කුලියට දීමේදී , ද්විතීය වශයෙන් කුලියට ගත් තැනැත්තා(ජදබ්රහ යසරුර) සමග ප්‍රාථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා තවදුරටත් වූ ගිවිසුමකට ඇතුලත් වන බවට සහතින වීම සඳහා ඔබ ඔබේ වාහනය ප්‍රථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා සමග එකඟ විය යුතුය. ද්විතීය වශයෙන් කුලියට ගත් තැනැත්තා නියමිත ආකෘති පත්‍රයෙන් වූ ප්‍රකාශයක් ප්‍රාථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා සමඟ අත්සන් කල යුතු අතර එය එම ගිවිසුමේ කොටසක් විය යුතුය.

ඔබේ වාහනය කුලියට දීමේදී සහ / හෝ නැවත කුලියට දීමේදී ඔබේ රක්ෂණ ඔප්පුවේ සඳහන් නියම හා කොන්දේසි පිළිපදින බවට සහ ඒවාට අනුකූලව ක්‍රියා කරන බවට ඔබ වග බලා ගත යුතුය.

ii. එම කුලියට ගත් තැනැත්තා වාහන රක්ෂණ ආවරණයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ පුද්ගලයකු නොවිය යුතු අතර එසේම ඔහුගේ රක්ෂණ ඔප්පුවක් අවලංගු වූ පුද්ගලයෙකු නොවිය යුතුය. එසේම හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමේ හේතුව මත විශේෂ කොන්දේසියක් පනවා ඇති හෝ රක්ෂණ වාරිකය වැඩි කරනු ලැබූ පුද්ගලයෙකු නොවිය යුතුය.

iii. ඔබගේ හිමිකම්පෑම සලකා බැලීම සඳහා ඔබ විසින් කුලියටදීමේ ගිවිසුම් වල පිටපතක් සහ ප්‍රකාශවල පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

iv. පහත දැක්වෙන මුදල් අප විසින් ගෙවනු නොලැබේ:

(අ) එක් එක් සහ සෑම හිමිකම් පෑමකම පළමුවන රු.6,000/-

(ආ) ප්‍රාථමික වශයෙන් කුලියට ගත් තැනැත්තා විසින් හෝ ද්විතීය වශයෙන් කුලියට ගත් තැනැත්තා විසින් වාහනය සොරකම් කිරීම හෝ හැරවීම හේතුකොට ගෙන ඉදිරිපත් කරනු ලබන හිමිකම්පෑමක් සඳහා:

(ඇ) ද්විතීය වශයෙන් කුලියට ගත් තැනැත්තාට පසුව තවදුරටත් කුලියට දීම සම්බන්ධයෙන් පැන නගින යම් හිමිකම්පෑමක් සඳහා:

## 13. රිය පැදවීමේ පුහුණුව ලබා දීම:

අතිරේක රක්ෂණ වාරිකයක් ගෙවීමට යටත්ව , රිය පැදවීමේ පුහුණුව ලබන්නන් සම්බන්ධයෙන් 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ නියමයන්ට යටත්ව, රිය පැදවීමේ පුහුණුව සඳහා ඔබේ වාහනය භාවිත කරන අතර තුර ඔබ හෝ ඔබේ බලයලත් නියෝජිතයා අප විසින් ආවරණය කරනු ලැබේ. තවද, වෙනත් අදාල අතිරික්තයන්ට අමතරව එක් එක් හිමිකම්පෑම මත රු.2,500/- බැගින් වූ අනිවාර්ය අතිරික්තයක් ඔබ විසින් දැරිය යුතුය.

## 14. තීරු බදු රහිත වාහන:

අතිරේක රක්ෂණ වාරිකයක් ගෙවීමට යටත්ව, දේශීය රේගු බදු නොමැතිව ඔබේ වාහනයේ උපාංග සහ අමතර කොටස් ඇතුලු ඔබේ වාහනයේ වටිනාකම ඔබේ රක්ෂණ ඔප්පුව යටතේ රක්ෂණය කර ඇති මුදල වශයෙන් අප විසින් සලකනු ලැබේ. අමතර කොටස් අලුතින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් ඔබේ රක්ෂණ ඔප්පුවේ පළවන වගන්තිය යටතේ හිමිකම්පෑමක් ඉදිරිපත් කිරීමේදී , එම අමතර කොටස්වල දේශීය රේගු බදු ගාස්තු අප විසින් ගෙවනු නොලැබේ.

## 15. වැඩ වර්ජන,කැරලි කෝලාහල සහ සිවිල් කෝලාහල:

රක්ෂිතයා විසින් අතිරේක රක්ෂණ වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙම රක්ෂණ ඔප්පුවේ 4 වන සාමාන්‍ය ව්‍යතිරේකයේ ඇති වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කෝලාහල යන වචන, මෙහි පහත දක්වා ඇති සිදු වීම් වලින් සෘජුවම සිදුවන අනතුරකට, පාඩුවකට, අලාභයකට හෝ බැරකමකට අදාල නොවිය යුතු බවට මෙයින් ප්‍රකාශ කර එකඟ වනු ලැබේ.

1. (වැඩ වර්ජනයන් හෝ සේවකයන් පිටතට දැමීමක් සම්බන්ධයෙන් වුවද එසේ නැති වුවද) යම් සාමය කඩ කිරීමේ ක්‍රියාවකදී වෙනත් තැනැත්තන් සමග එක්ව යම් තැනැත්තකු විසින් කරනු ලබන ක්‍රියාවක් හෝ එවැනි සාමය කඩ කිරීමේ ක්‍රියාවක් මැඩ පැවැත්වීමේදී හෝ මැඩපැවත්වීමට උත්සහ කිරීමේදී හෝ එම සාමය කඩ කිරීමේ අහිතකර ප්‍රතිපල අවම කිරීමේදී නීත්‍යානුකූලව සංයුක්ත වූ අධිකාරියක් විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයක්:

2. වැඩ වර්ජනයකට සහය දැක්වීමක් වශයෙන් හෝ සේවා ස්ථානයෙන් පිටත දැමීමට ප්‍රතිරෝධයපෑමක් වශයෙන් වැඩ වර්ජනයට සහභාගී වන සේවකයකු විසින් සිතා මතා කරනු ලබන ක්‍රියාවක්: එසේ වුවද මේ වගන්තිය ප්‍රකාරව ලබාදී ඇති හානිපූර්ණය, පහත දැක්වෙන අවස්ථා මගින් සෘජුවම හෝ අන්‍යාකාරයකින්, ආසන්න වශයෙන්, සිදු වන හෝ ඊට දායක වන හෝ සම්බන්ධතා ඇති හෝ එමගින් උපචිත වන හෝ ඒ හා සම්බන්ධව සිදු වන (මෙම නීතියේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍යවන තාක් දුරට හැර)අනතුරු වලට,පාඩු වලට හෝ අලාභවලට හෝ බැරකම් වලට අදාල නොවන්නේය. එම අවස්ථා මෙසේය:-

(අ) යුද්ධය, ආක්‍රමණය කිරීම, විදේශීය හමුදාවන්ගේ ක්‍රියා, එදිරිවාදිකම් හෝ යුද්ධය වැනි මෙහෙයුම් (යුද්ධ ප්‍රකාශ කර සිදු කලද එසේ නැති වුවද) සිවිල් යුද්ධ මගින් සිදු වන අනතුරක්, පාඩුවක්, අලාභයක් හෝ බැරකමක්:

(ආ) ප්‍රමාණය අනුව ජනප්‍රිය උද්ඝෝෂණයක් බවට පත්වන හමුදාව තුළ කරලි ගැසීම්, සිවිල් අරගල, හමුදා විප්ලව, කැරලි ගැසීම්, ජනතා විප්ලව, ත්‍රස්තවාදී ක්‍රියා යුදමය හෝ රාජ්‍ය බලය, හෝ නීත්‍යානුකූලව පත් වී ඇති රජය බලෙන් පහ කිරීමට ක්‍රියා කරන සංවිධානයක් වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවලින් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් රජයට බලපෑම් කරන ක්‍රියාවලින් සිදුවන අනතුරක්, පාඩුවක්, අලාභයක් හෝ බැරකමක:

මේ යටතේ යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කල විට, අනතුර, පාඩුව, අලාභය හෝ බැරකම උපචිත වුයේ ඉහත වුවත් ඉහත කී සිදුවීම්වලට පරිබාහිරව සහ එම සිදුවීමවලට සම්බන්ධයක් නොමැති බවට එම සිද්ධිවල ප්‍රතිපලයක් ලෙස සිදු නොවූ බවට රක්ෂිතයා විසින් ඔප්පු කල යුතු අතර එසේ ඔප්පු කිරීම පැහැර හැරීමේදී එවැනි හිමිකම් පෑමක් සම්බන්ධයෙන් කිසිදු මුදලක් ගෙවීමට රක්ෂණ සමාගම වගකීමකට යටත් නොවේ.

මෙම රක්ෂණ ඔප්පුවේ 4 වන වගන්තියේ කුමක් සඳහන් වුවද එය නොතකා, රක්ෂිතයා දැනුම්දී තිබූ අවසාන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීමෙන් පසු කවර හෝ අවස්ථාවකදී රක්ෂණ සමාගම විසින් මෙම රක්ෂණය අවසන් කල හැකි අතර එවැනි අවස්ථාවකදී රක්ෂණ ඔප්පුව අවසන් කල දින සිට ඉතිරිව ඇති රක්ෂණ කාල සීමාව සඳහා රක්ෂණ වාරිකයෙන් අනුපාතික මුදලක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටින බවටත් රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි රක්ෂණ ගිවිසුම අවසන් කරනු ලැබුවහොත් රක්ෂණ වාරිකය හෝ එහි යම් කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම වගකීමකට යටත් නොවන බවටත් තව දුරටත් ප්‍රකාශ කර එකඟ වේ.

මෙම දිර්ඝ කිරීම පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත් වන බවට තවදුරටත් ප්‍රකාශ කර එකඟ වේ.

(අ) විකිරණ සමඟ මිශ්‍ර වීම, රසායනික ජීව විද්‍යාත්මක ජීව රසායනික සහ විද්‍යුත් චුම්භක ආයුධ බැහැර කිරීමේ වගන්තිය ඇතුලත් කිරීම.

මෙම වගන්තිය ඉතා වැදගත් වන අතර මීට අනුකූල වන පරිදි මෙම රක්ෂණ ඔප්පුවේ අන්තර්ගත වෙනත් කිසිවක් අභිබවා ක්‍රියාත්විත විය යුතුය.

1. පහත දැක්වෙන සිදුවීම් හේතුකොට ගෙන සෘජුවම හෝ අන්‍යාකාරයකින් සිදුවන හෝ එම සිදුවීම් දායක වී ඇති හෝ එම සිදුවීම්වලින් උපචිත වී ඇති පාඩුවක්, අලාභයක් බැරකමක් හෝ වියදමක් මෙම රක්ෂණ ඔප්පුව මගින් ආවරණය නොවේ.

1.1 යම් න්‍යෂ්ටික ඉන්දන වලින් හෝ න්‍යෂ්ටික අපද්‍රව්‍ය වලින් හෝ න්‍යෂ්ටික ඉන්ධන දහනය වීම මගින් සිදුවන විකිරණ ක්‍රියාමගින් විකිරණ අයනීකරණයවීම හෝ එම විකිරණවලින් විෂ වායු පිට වීම,

1.2 යම් න්‍යෂ්ටික අවි සවිකර ඇති ස්ථානයකින්, න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරයකින්, හෝ වෙනත් න්‍යෂ්ටික අවි එකලස් කරන ස්ථානයකින් හෝ එහි ඇති න්‍යෂ්ටික සංඝටිතවලට පිටවන විකිරණශීලී, විෂසහිත, පිපිරුම් ස්වභාවයේ හෝ වෙනත් හානිකර හෝ විෂ පැතිරීමකින් ඇතිවන අයනීකරණ විකිරණය.

1.3 පරමාණු හෝ න්‍යෂ්ටික විඛණ්ඩනය සහ/හෝ වියලනය හෝ වෙනත් ප්‍රතික්‍රියාවක් හෝ විකිරණ බලය හෝ ද්‍රව්‍ය යොදා ගන්නා යම් ආයුධයක් හෝ උපකරණයක්.

1.4 යම් විකිරණශීලී ද්‍රව්‍යයක ඇති විකිරණශීලී, විෂ සහිත පිපිරීම් ස්වභාවයේ හෝ වෙනත් අනතුරුදායක හෝ විෂ ගති ලක්ෂණ මෙම උප වගන්තියේ ඇති බැහැර කිරීම , විකිරණශීලී සමස්ථානික(සිදඑදඩි) පිලියෙල කරන විට, රැගෙන යන විට, ගබඩා කර ඇති විට හෝ වානිජ ,කෘෂිකාර්මික ,වෛද්‍ය විද්‍යාත්මක හෝ වෙනත් සාමකාමී කාර්යන් සඳහා භාවිත කරන විට එම සමස්ථානිකවලට අදාළ නොවන අතර න්‍යෂ්ටික ඉන්ධනවලට එය අදාළ වේ.

1.5 යම් රසායනික, ජීව විද්‍යාත්මක ,ජීව රසායනික හෝ විද්‍යුත් චුම්භක අවි.

(ආ) සයිබර් ප්‍රහාර බැහැර කිරීමේ වගන්තිය ඇතුලත් කිරීම.

1.1 මෙහි පහත 1.2 වගන්තියට පමණක් යටත්ව, හානියක් සිදුකිරීමේ ක්‍රමයක් වශයෙන් යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංග වැඩ සටහනක්, ද්වේශ සහගත පද්ධතියක්, පරිගණක වයිරස් හෝ ක්‍රියා පිළිවෙතක් හෝ වෙනත් යම් විද්‍යුත් පද්ධතියක් මගින් සෘජුවම හෝ අන්‍යාකාරයකට සිදුකරනු ලබන හෝ සිදුකිරීමට දායක වන හෝ ඒවා භාවිත කිරීමෙන් උපචිත වන යම් පාඩුවක්, අලාභයක් බැරකමක් හෝ පිරිවැයක් මෙම රක්ෂණ ඔප්පුව මගින් ආවරණය නොවේ.

1.2 යුද්ධය, සිවිල් යුද්ධය, විප්ලවයක්, කැරැල්ලක්, ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ සිවිල් කලහයක් මගින් පැන නගින අවදානමක් ආවරණය වන රක්ෂණ ඔප්පු මත හෝ ප්‍රචණ්ඩ බලයන්ට හෝ ත්‍රස්තවාදයට එරෙහිව හෝ ඒවා විසින් සිදුකරනු ලබන එදිරිවාදී ක්‍රියාවන් මගින් පැන නගින අවදානමක් හෝ දේශපාලන අරමුණක් ඇතිව ක්‍රියාකරන තැනැත්තකුගේ ක්‍රියාවකින් පැන නගින අවදානමක් ආවරණය වන රක්ෂණ ඔප්පු මත මෙම වගන්තිය පිටයන් කරනු ලබන විට යම් අවියක් හෝ මිසයිල් එකක් ක්‍රියාත්මක කිරීමේදී හා/හෝ මාර්ගෝපදේශ පද්ධතියේ සහ /හෝ වෙඩි තැබීමේ යන්ත්‍රයක් භාවිත කරන පරිගනකයක් ,පරිගණක පද්ධතියක් හෝ පරිගණක මෘදුකාංග වැඩසටහනක් භාවිත කිරීමෙන් පැන නගින (අන්‍යාකාරයකට ආවරණය විය හැකිව තිබූ) පාඩු බැහැර කිරීමට ඉහත 1.1 වගන්තිය ක්‍රියාත්මක නොවිය යුතුය.

මෙම දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලබන්නේ ජාතික රක්ෂණ භාරකාර අරමුදල සඳහා හෝ එය වෙනුවෙන් වන අතර මෙම විශේෂිත දීර්ඝ කිරීම යටතේ වන කවර හෝ බැරකමක් එකී අරමුදල වෙත පමණක් සාරෝපණය විය යුතුය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී හෝ නීතිකෘත්‍යකදී යම් පාඩුවක් හෝ අලාභයක් මෙම පිටසන් කිරීම මගින් ආවරණය නොවන බවට චෝදනා කරනු ලබන අවස්ථාවකදී එම පාඩුව හෝ අලාභය ඔප්පු කිරීමේ භාරය රක්ෂිතයා වෙත පැවරේ.

කෙසේ වුවද මෙය රක්ෂණ ඔප්පුවේ නියම, කොන්දේසි , බැහැරකිරීම් සහ ව්‍යතිරේකවලට යටත් වේ.

## 16. ත්‍රස්තවාදය.

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමේදී , ලිඛිත රක්ෂණ ඔප්පුවේ වැඩ වර්ජන , කැරලි කෝලාහල , සිවිල් අරගල යන කරුණුවලට අදාළ වගන්තියට පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා, නීත්‍යානුකූලව පත් කර ගන්නා ලද රජය හෝ යම් පළාත් සභාවක් හෝ පළාත්පාලන ආයතනයක් බලහත්කාරයෙන් හෝ බියගැනිවීම, ත්‍රස්තවාදී ක්‍රියා හෝ ප්‍රචණ්ඩත්වය මගින් පෙරලා දැමීමට කටයුතු කරන (යම් සංවිධානයක් හෝ මණ්ඩයක් හෝ තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායමක් වෙනුවෙන් කටයුතු කරන) යම්

තැනැත්තකුගේ ක්‍රියාවක් මගින් ඍජුවම රක්ෂිත වාහනයට සිදුවන හෝ සිදුකිරීමට සලස්වන යම් භෞතික පාඩුවක් හෝ අලාභයක් ආවරණය කිරීම සඳහා මෙම රක්ෂණ ඔප්පුව මගින් ලබාදී ඇති රක්ෂණය දීර්ඝ කරනු ලැබේ.

එසේ වුවද මෙම දීර්ඝ කිරීම මගින් පහත සඳහන් අවස්ථා ආවරණය නොවේ.

(අ) කවර හෝ වර්ගයකට හෝ විස්තරයකට අයත් ආනුෂංගික හෝ ඍජු නොවන පාඩුවක් හෝ අලාභයක්:

(ආ) සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් වැඩ නැවැත්වීම හේතු කොට ගෙන හෝ යම් ක්‍රියාවලියක් හෝ මෙහෙයුමක වේගය අඩු කිරීම, ඊට බාධා කිරීම හෝ එය නැවත්වීම හේතුකොට ගෙන සිදුවන පාඩුවක් හෝ අලාභයක්:

(ඇ) නීත්‍යානුකූලව සංස්ථාපනය කරන ලද අධිකාරියන් විසින් රාජ සන්තක කිරීම, බලෙන් ලබා ගැනීම හෝ ඉල්ලා සිටීම හේතු කොට ගෙන ස්ථිරව හෝ තාවකාලික වශයෙන් වාහනය අන්සතු වීම නිසා සිදු වන පාඩුවක් හෝ අලාභයක්:

යම් රක්ෂිත වාහනයකට සිදු වන අලාභය සම්බන්ධයෙන් වන උපරිම වගකීම රක්ෂිත මුදලට සීමා වේ.

මෙම දීර්ඝ කිරීම ප්‍රදානය කරනුයේ හුදෙක්ම ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන් වන අතර මෙම විශේෂිත දීර්ඝ කිරීම යටතේ වූ කවර හෝ බැරකමක් එකී අරමුදල වෙත පමණක් සාරෝපණය විය යුතුය.

රක්ෂණ ඔප්පුවේ පටහැනිව කුමක් සඳහන් වුවත් එය නොතකා රක්ෂණ ඔප්පුවේ ඇති ත්‍රස්තවාදයට අදාළ දීර්ඝ කිරීම රක්ෂණ සමාගම විසින් අවලංගු කරනු ලැබුවහොත් රක්ෂිතයාට ප්‍රමාණානුකූල මුදලක් ආපසු ගෙවනු ලැබේ. ඒ තාක් රක්ෂිතයාගේ ඉල්ලීම පරිදී මෙම දීර්ඝ කිරීම අවලංගු කරනු ලැබුවහොත් , රක්ෂණ වාරිකයෙන් කිසිදු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.

ඉහත කී කරුණු මෙම රක්ෂණ ඔප්පුවේ ඇති නියම, කොන්දේසි , බැහැර කිරීම් සහ ව්‍යතිරේකවලට යටත් වේ.

## 17. අනිවාර්ය අතිරික්ත :

වෙනත් අදාළ අතිරික්ත මුදල් වලට අමතරව, එක් එක් හිමිකම් පෑම සම්බන්ධයෙන් ඔබේ උපලේඛනයේ සඳහන් මුදල අනිවාර්ය අතිරික්ත මුදලක් ලෙස ඔබ විසින් සලකනු ලැබිය යුතුය.

## 18. ආයතනික ණය/උකස් කිරීම :

ඔබගේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආයතනයට ඔබගේ වාහනය ඇපයක් වශයෙන් තබා එම ආයතනයේ අත්තිකාරම් මුදලක් /ණයක් ලබා ගෙන ඔබගේ වාහනය ආයතනික ණයකට /උකසකට යටත් කර ඇත්නම් , ඔබේ උපලේඛනයේ නම සඳහන් ආයතනය ඔබේ වාහනයේ අයිතිකරු ලෙස අප විසින් සළකනු ලබන අතර ඔබේ වාහනයට අනතුරක් හෝ පාඩුවක් සිදු වීමේදී එය අලූත්වැඩියා කිරීමෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් හෝ ප්‍රතියෝජනය කිරීමෙන් එම අලාභය සඳහා පිළියම් කළ නොහැකි නම් එම හිම්කම්පෑම සඳහා මුදල් එම ආයතනයට ගෙවනු ලබන අතර එකී මුදල එම ආයතනය විසින් ලබා ගැනීම මගින් අප එම වගකීමෙන් සම්පූර්ණ හා අවසාන වශයෙන් නිදහස් වේ. මෙම වගන්තිය මගින් ප්‍රකාශිතව එකඟ වී ඇති කරුණු සම්බන්ධයෙන් හැර ඔබේ රක්ෂණ ඔප්පුව යටතේ ඔබගේ සහ අපේ අයිතිවාසිකම් හෝ බැරකම්වලට මෙම වගන්තියෙන් බලපෑමක් සිදු නෙවේ.

## 19. විකල්ප ප්‍රවාහන වියදම් :

අතිරේක රක්ෂණ මුදලක් ගෙවීමට යටත්ව, ඔබේ වාහනයට අනතුරක්වීමෙන් පසු ඔබේ වාහනය අළුත්වැඩියා කරන කාල සීමාව දින 3 ක් ඉක්මවන්නේ නම්, දින 3 සිට දින 15 දක්වා වූ උපරිම කාලසීමාවක් තුළ විකල්ප ප්‍රවාහන ගාස්තු වශයෙන් දින ගණන අනුව මුදලක් ඔබට ගෙවනු ලැබේ.මෙම දීර්ඝ කිරීම මෝටර් වාහන තක්සේරුකරුගේ ඇගයීමකට යටත්ව කරනු ලබන නිර්දේශයන් මත පදනම් වේ.

## 20. ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ (අනතුරුදායක)

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව, ඔබේ වාහනය වෙනත් වාහනයක ගැටීමෙන් හෝ වෙනත් ද්‍රව්‍යයක ගැටීමෙන් හෝ වාහනය පෙරළීමෙන් වාහනයේ රැගෙන ගිය භාණ්ඩවලට සිදු වූ අලාභය සඳහා මේ වගන්තියට අදාලව ඔබේ උපලේඛනයේ සඳහන් මුදල දක්වා අප විසින් ආවරණය කරනු ලැබේ.

ඔබේ වාහනයේ රැගෙන යන භාණ්ඩ වලට ගින්නෙන්, පිපිරීම්වලින්, වැඩ වර්ජනවලින්, කැරලි කෝලාහලවලින්, සිවිල් අරගලවලින් සහ ත්‍රස්තවාදී ක්‍රියාවලින් සිදුවන අලාභ විශේෂයෙන් අනාවරණය කර නැත්නම් එම අවදානම් තත්වවලින් සිදුවන අලාභ අප විසින් ආවරණය කරනු නොලැබේඅනතුර සිදුවූ අවස්ථාවේදී වාහනයේ තිබූ භාණ්ඩවල වටිනාකම ඔබේ රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ සඳහන් ආවරණ මුදලට වඩා වැඩි නම් , ඔබගේ හිමිකම්පෑම සඳහා ගෙවන මුදල අනුපාතිකව අඩු කරනු ලැබේ.

**පහත දැක්වෙන භාණ්ඩ අප විසින් ආවරණය කරනු නොලැබේ.**

පිගන් භාණ්ඩ සහ මැටි භාණ්ඩ, ආභරණ, වීදුරු භාණ්ඩ, ගෘහභාණ්ඩ, ස්වර්ණාභරන, පශු සම්පත්, වයින් හෝ ස්පිරිට් වර්ග, පරණ පත්තර, විද්‍යාත්මක උපකරණ, බිත්ති ඔරලෝසු හෝ ෆයිබර්ගෑස් (FibreGases) අත් ඔරලෝසු, විදුලි උපකරණ හෝ අමතර කොටස්, පින්තූර, මුද්‍රණ පිටපත් හෝ රූප සටහන්, කපු, කපු වල අපද්‍රව්‍ය, වීදුරු භාජන වල බහා ඇති භාණ්ඩ, පුපුරණ ද්‍රව්‍ය, ඡායාරූප ගැනීමේ උපකරණ- කපොක්, විදුලි අයිතම (Electronic Items), ගිණිගන්නා සුළු ද්‍රව්‍ය, ෆයිබර් (Fibre), කපු, කපු වල ඉතිරි කොටස්, කැපොක් ගෑස් වර්ග, කාර්මික අපද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය, වෙනත් නරක් විය හැකි ද්‍රව්‍ය මෙම දීර්ඝ කිරීම යටතේ විශේෂයෙන් ආවරණය කර ඇත්නම් මිස අප විසින් මෙම ද්‍රව්‍ය ආවරණය කරනු නොලැබේ.

## 21. ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ (අනතුරුදායක නොවන):

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව, ඔබේ වාහනය වෙනත් වාහනයක ගැටීමෙන් හෝ වෙනත් ද්‍රව්‍යක ගැටීමෙන් හෝ වාහනය පෙරළීමෙන් වාහනයේ රැගෙන ගිය භාණ්ඩවලට සිදු වූ අලාභය සඳහා මේ වගන්තියට අදාලව ඔබේ උපලේඛනයේ සඳහන් මුදල දක්වා අප විසින් ආවරණය කරනු ලැබේ.

ඔබේ වාහනයේ රැගෙන යන භාණ්ඩ වලට ගින්නෙන්, පිපිරීම්වලින්, වැඩ වර්ජනවලින්, කැරලි කෝලාහලවලින්, සිවිල් අරගලවලින් සහ ත්‍රස්තවාදී ක්‍රියාවලින් සිදු වන අලාභ විශේෂයෙන් ආවරණය කර නැත්නම් එම අවදානම් තත්ව වලින් සිදු වන අලාභ අප විසින් ආවරණය කරනු නොලැබේ. අනතුර සිදු වූ අවස්ථාවේදී වාහනයේ තිබූ භාණ්ඩ වල වටිනාකම ඔබේ රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ සඳහන් ආවරණ මුදලට වඩා වැඩි නම්, ඔබගේ හිමිකම් පෑම සඳහා ගෙවන මුදල අඩු කරනු ලැබේ.

## 22. වාහනයේ අමතර කොටස් හා උපාංග සොරකම් කිරීම :

අතිරේක රක්ෂණ වාරිකයන් ගෙවීමට යටත්ව ,ගෙවල් බිඳීම හෝ සොරකම් කිරීම මඟින් ඔබේ වාහනයේ අමතර කොටස්,උපාංග හෝ අත්‍යාවශ්‍ය කොටස් නැති වීම හෝ ඒවාට අලාභ සිදු වීම අප විසින් ආවරණය කරනු ලැබේ.

## 23. වාරික ගෙවීමේ වගකීම් සහතිකය :

i. මෙහි අන්තර්ගතව කුමක් සඳහන් වුවද එය නොතකා යන මෙහි 2 වන සහ 3 වන වගන්තිවලට යටත්ව මෙම රක්ෂණය සම්බන්ධයෙන් ගෙවිය යුතු සම්පූර්ණ රක්ෂණ වාරිකය, මෙම රක්ෂණ ඔප්පුවේ උපලේඛනයේ, අලූත් කිරීමේ සහතිකයේ, පිටසන් කිරීමේ හෝ ආවරණ දැන්වීමේ සඳහන් රක්ෂිත වාරිකය ගෙවිය යුතු දිනයේදී හෝ එදිනට පෙර(එනම් රක්ෂණ ඔප්පුව ආරම්භ වන දින සිට දින 60ක් නොඉක්මවන දිනයක් වන) දිනයකදී ගෙවා බේරුම් කල යුතු බවටත් එවැනි වාරික ගෙවිය යුතු දිනයක් සඳහන් කර නොමැති විට, මෙම රක්ෂණ ඔප්පුව, අලූත් කිරීමේ සහතදකය, පිටසන් කිරීම හෝ ආවරණ දැන්වීම සහ ලේඛන වල ආරම්භක දිනයෙ සිට 60 වන දිනය අවසන් වීමට පෙර රක්ෂණ වාරිකය සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කල යුතු බවට මෙසේ එකඟ වී ප්‍රකාශ කරනු ලැබේ.(එම දිනය මෙහි මින් මතු මුදල් අය වීමට ඇති‘ නියමිත දිනය’ යනුවෙන් හඳුන්වනු ලැබේ) මෙම වගකීම් සහතිකයේ කර්ය සඳහා මුදල් අයවීමට ඇති‘ නියමිත දිනය’ යන්නෙන් රක්ෂණය ආවරණය ආරම්භ වන දිනය සලකනු ලැබේ.

ii. මුදල් අය වීමට ඇති දිනයේදී හෝ එදිනට පෙර සම්පූර්ණ වාරිකය ගෙවා බේරුම් කිරීම , මෙම රක්ෂණ ඔප්පුව, අලූත් කිරිමෙ සහතිකය, පිටයන් කිරීම හෝ ආවරණ සටහන යන ලේඛන යටතේ

හිමිකම්පෑමක් බේරුම් කිරීමට රක්ෂණකරුට (සමාගමට) ඇති බැරකම හෝ බැඳීම ඉටු කිරීමට පෙර ඉටු විය යුතු කොන්දේසියන් ලෙස ක්‍රියාත්මක විය යුතු බවට මෙයින් ප්‍රකාශ කර එකඟ වනු ලැබේ.

මෙම රක්ෂණය ආරම්භ වන දිනය සහ රක්ෂණ වාරිකය ගෙවා බේරුම් කලයුත "නියමිත දිනය" අතර යම් හිමිකම්පෑමක් උපචිත වුවහොත්, එවිට "නියමිත දිනය" හෝ එදිනට පෙර රක්ෂණ වාරිකය සම්පූර්ණයෙන් ගෙවා බේරුම්කරන තුරු රක්ෂණකරු (සමාගම) විසින් බැරකම් පිළිබඳ තීරණය කල් තැබිය හැකි අතර නැතහොත් එම හිමිකම්පෑම සඳහා මුදල් ගෙවා බේරුම් කිරීම කල් තැබිය හැකිය.

iii. "වාරික මුදල ගෙවීමට නියමිත දිනයේදී" රක්ෂණකරුගේ ව්‍යාපාර කටයුතු වසා දමන අවස්ථාව වන විට මේ යටතේ ගෙවිය යුතු සම්පූර්ණ රක්ෂණ වාරිකය හිඟ තබා ඇති විට, මෙම රක්ෂණය යටතේ ඇති ආවරණය සහ මෙම රක්ෂණය යටතේ උපකල්පනය කර ඇති හෝ ආරෝපණය වී ඇති බැඳීම වහාම අවලංගු වී අවසන් වී සහ ප්‍රත්‍යාදිෂ්ට වන්නේය.

කෙසේ වුවද එම අවලංගු වීම මගින්, නීතිමය විත්ති වාචික ඉදිරිපත් කිරීමට හෝ රක්ෂණය ඉකුත් වී ඇති කාලයට අදාල ගෙවීම පැහැර හැර ඇති වාරික සම්පූර්ණයෙන් හෝ ඉන්කොටසක් අය කර ගැනීමට රක්ෂණකරුට (සමාගමට) ඇති අයිතියට බාධාවක් සිදු නොවේ.

## 24. දත්ත රහස්‍යතාවය හා ආරක්ෂාව

අපි අපගේ ව්‍යාපාරය පූර්ණ අනුකූලතාවයෙන් සහ අදාළ දත්ත රහස්‍යතා ආරක්ෂණ නීති හා රෙගුලාසිවලට අනුකූලව කරගෙන යාමට දැඩි ලෙස කැප වී සිටිමු. පුද්ගලිකත්වයට සම්බන්ධ සියළු කරුණු අපගේ නිල වෙබ් අඩවියේ **https://www.allianz.lk/data-privacy-notice.html** හි දක්වා ඇති අලියාන්ස් රහස්‍යතා දැන්වීම මගින් පාලනය වේ. එමගින් කියැවෙනුයේ පුද්ගලික දත්ත එක්රැස් කරන්නේ කෙසේද සහ කුමන වර්ගයේ දත්ත එක්රැස් කරන්නේද, එක්රැස් කරනු ලබන්නේ කුමකටද සහ කුමන පාර්ශව වෙත එම දත්ත ලබා දෙන්නේද හෝ හෙළි කරනු ලබන්නේද යන්නය. තවද, දත්ත එකතු කරන ලද අරමුණු ඉටුකර ගැනීමට හෝ නීතිමය බැඳීම් ඉටුකිරීමට අවශ්‍ය තාක් කල් ඔබේ පුද්ගලික දත්ත තබා ගැනීමට අපි කැපවී සිටිමු.

නිර්වචනයඃ

**පුද්ගලික දත්ත** : පුද්ගලයෙකුට අදාළ ඕනෑම තොරතුරක් අදහස් කරයි.

## පරිශිෂ්ඨය (Appendix)

අමතර කොටස් වලට අලාභ හානි සිදු වූ විට, ඒවා වෙනුවට අලුත්ම අමතර කොටස් ලබා දීමේදී මෝටර් සයිකල් සහ ත්‍රී වීලර් හැර අනෙක් සියලුම වාහන සඳහා රක්ෂිතයා විසින් දායක වන මුදල් ප්‍රමාණයන්.

| වාහනයේ වයස | සියලු බඳ කොටස් (body parts) වීදුරු සහ නිෂ්පාදන කර්මාන්ත ශාලාවේදී සවිකල සවි කිරීම් | | යාන්ත්‍රික, විදුලි සහ විද්‍යුත් අමතර කොටස් | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි කරන ලද අලුත් වාහන | නව / භාවිතා කරන ලද රථ වාහන | ලියාපදිංචි කරන ලද අලුත් වාහන | නව / භාවිතා කරන ලද රථ වාහන |
| අවුරුදු 1 අඩු | 0% | 20% | - | 30% |
| අවුරුදු 1 වැඩි | 0% | 35% | 10% | 40% |
| අවුරුදු 2 වැඩි | 0% | 35% | 20% | 50% |
| අවුරුදු 3 වැඩි | 15% | 35% | 30% | 50% |
| අවුරුදු 4 වැඩි | 20% | 35% | 40% | 50% |
| අවුරුදු 5 වැඩි | 25% | 35% | 50% | 50% |
| අවුරුදු 6 වැඩි | 30% | 35% | 50% | 50% |
| අවුරුදු 7 වැඩි | 35% | 40% | 50% | 50% |
| අවුරුදු 8 වැඩි | 40% | 40% | 50% | 50% |

අමතර කොටස් වලට අලාභ හානි සිදු වූ විට, ඒවා වෙනුවට අලුත්ම අමතර කොටස් ලබා දීමේදී මෝටර් සයිකල් සහ ත්‍රී වීලර් සඳහා රක්ෂිතයා විසින් දායක වන මුදල් ප්‍රමාණයන්.

| වාහනයේ වයස | බඳේ අමතර කොටස්, වීදුරු සහ කර්මාන්තශාලාවේදී සවිකල සවි කිරීම | යාන්ත්‍රික, විදුල සහ විද්‍යුත් අමතර කොටස් |
|---|---|---|
| අවුරුදු 1 අඩු | - | 25% |
| අවුරුදු 1 වැඩි | 10% | 30% |
| අවුරුදු 2 වැඩි | 15% | 40% |
| අවුරුදු 3 වැඩි | 20% | 50% |
| අවුරුදු 4 වැඩි | 25% | 50% |
| අවුරුදු 5 වැඩි | 30% | 50% |
| අවුරුදු 6 වැඩි | 35% | 50% |
| අවුරුදු 07 -10 අතර | 40% | 50% |
| අවුරුදු 10 -20 අතර | 40% | 50% |
| අවුරුදු 20 වැඩි | 40% | 50% |

හයිබ්‍රිඩ් (Hybrid)/ විදුලි වාහන හැර වෙනත් සියලූ වාහන සඳහා ටයර් / ටියුබ් සහ බැටරි සඳහා අයිතිකරුගේ උපරිම දායකත්වය 50% කි.

**කෙටි කාලීන මුදල් ආපසු ගෙවීමේ අනුපාත සඳහන් වගුව.**

**ගණුදෙනුකරු විසින් අවලංගු කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී අදාළ වේ.**

| **භාවිතා කරනු ලැබූ කාල සීමාව** | **ආපසු ගෙවීම සඳහා අනුමත ප්‍රතිශතය (මූලික වාරික මුදලට අනුව)** |
|---|---|
| සතියකට වඩා අඩු කාලයක් | 87.50% |
| මාසයක කාලයක් දක්වා | 75% |
| මාස දෙකක (2) කාලයක් දක්වා | 62.50% |
| මාස තුනක (3) කාලයක් දක්වා | 50% |
| මාස හතරක (4) කාලයක් දක්වා | 37.50% |
| මාස හයක (6) කාලයක් දක්වා | 25% |
| මාස අටක (8) කාලයක් දක්වා | 12.50% |
| මාස අටකට (8) වඩා වැඩි කාලයක් සඳහා | ආපසු ගෙවීමක් නොමැත. |

**මෙම මෝටර් වාහන රක්ෂණ ඔප්පුවේ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.**